# උඩුනුවර ප්‍රාදේශීය සභාවේ පැවති 07 වන සභා වාරයේ පනස් හත්වන සභා රැස්වීම් වාර්තාව

දිනය ෘ- 2022.12.15 පෙ.ව. 9.45

| | | |
|---|---|---|
| 1. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ර්.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 9. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 18. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 19. | එන්. අමරකීර්ති මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 20. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 21. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 22. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 23. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 24. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 25. | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 26. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 4. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | කේ.බී.විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

ගරුසභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා අසනීප තත්වයෙන් පසුවීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව පවසා ලිපියක් යොමුකර ඇති නිසා බහුතරයේ කැමැත්ත පරිදි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මහතාගේ හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම් කුලතුංග මයාගේ යෝජනා ස්ථිරත්වයෙන් අදදින මූලාසනය හෙබවීම සඳහා ගරුඋප සභාපතිතුමා පැමිණෙන තුරු ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා යෝජනා කරන ලදි.

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමෙන් පසු පෙ.ව. 9.45 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

රැස්වීම ආරම්භයේදී ගරු මන්ත්‍රීවරුන් 19 දෙනෙක් පැමිණ සිටින ලදී.

| | | |
|---|---|---|
| 1. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 2. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 4. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 7. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 16. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 18. | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 19. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා (මූලාසනය )**

මම මේ ස්ථානයේ සිටින විට මට යමක් හැගුන බවත්,අප විසින් පංච සීලයේ පිහිටුවන විට ගරුතර සංඝරත්නය නිශ්ශබ්දව අසුන් ගෙන සිටින බවත් , මෙතනට පැමිණි නිසා මට එය ක්ෂණිකව දැණුනු බවත් , අප, අප විසින්ම වැරැද්දක් කර ඇති බව හැගෙන බවත් , මට තේරුන බවත්,මේ සභාවාරය මේ මාසයෙන් දෙකෙන් ඉවර විය හැකි බවත් , නැවත මෙවැනි තත්වයකට පත් වුවහොත් මෙය අනිවාර්යයෙන්ම සකස් විය යුතු බවත් පෙන්වා දෙන ලදි.අදාල දිනයට අදාල වෙලාවට මේ ස්ථානයට පැමිණීමට අපේ ස්වාමින්වහන්සේටත් යුතුකමක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.52 ගරුඋප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා පැමිණෙන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතාට මූලාසනය භාරදෙන ලදි.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.53 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඩබ්. රාණි මැණිකේ මිය පැමිණෙන ලදි.

**ගරු උපසභාපතිතුමා (මූලාසනය )**

වේලාවට පැමිණීමට නොහැකිවීම පිළිබදව කනගාටු වන බවත්, මාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නිසා ප්‍රමාද වූ බවත් ප්‍රකාශ කරන ලදි.

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු උපසභාපතිතුමා( මූලාසනය )**

සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාගත කර ඇති පරිදි ස්ථිර කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

වැඩ බලන සභාපතිතුමනි, ප්‍රථමයෙන් තිබෙන්නේ සභාවාර්තාව ස්ථිර කිරීම වුවත් ,නමුත් ඊට මත්තෙන් අප සභාව විසින් සම්ප්‍රදායානුකූලව පවත්වාගෙන පැමිණි සෙංකෝලය අද නැති බවත් සෙංකෝලය තිබෙන කාමරයේ දොර අගුල වැටී ඇති බැවින් එය ගැනීමට නොහැකි වී ඇති බවත් , නමුත් සෙංකෝලය සභා ගර්භයට රැගෙන ඒම සිදුවිය යුතු බවත් ,එම නිසා විනාඩි 10 කට සභාව කල් තබා සෙංකෝලය රැගෙනවිත් නැවත සභාව පටන්ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

දැන් වේලාව ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.55 බවත් ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.10 දක්වා විනාඩි 15 කට සභාව කල් තබන බවත් ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 9.55 ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්. කුලතුංග මහතා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී.සුගන්ධි ෂාවිකා මිය පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.00 ගරු ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර්.චන්ද්‍රසේකර බංඩාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.10 ට සභාව නැවත ආරම්භ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා( මූලාසනය )**

**නොකඩවා පවත්වාගෙන පැමිණි චාරිත්‍රයට මුල්තැන දෙමින් සෙංකෝලය සභා ගර්භයට රැගෙන ඒම සිදු කිරීමට කටයුතු කල බවත් , පසුගිය සභා වාරයේ වාර්තාව සම්මත කර ගන්නා ලෙස නැවත ප්‍රකාශ කරන ලදී.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.25 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්. අමරකීර්ති මහතා පැමිණෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

සභා වාර්තාව සම්මත කරන්නට මත්තෙන් මම වචනයක් කතා කළ යුතු බවත් සෙංකෝලය පිළිබඳව පැන නැගුන ප්‍රශ්නයේදී සෙංකෝලය මෙතනට රැගෙන ආ බවත් මෙය බොහෝම ගෞරවාන්විතව මෙම සභාවට රැගෙන ඒම සිදු විය යුතු බවත් එය ගෞරවාන්විතව රැගෙන ඒම මෙම සභාවේ නිලධාරීන්ගේ වගකීම බවත් ගෞරවාන්විත ආකාරයට එම වගකීම ඉෂ්ට විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මෙම සභාවට අප සියලු දෙනාම සුදු ඇඳුම අත් දිගට ඇඳගෙන එන බවත් එමනිසා මෙම කාර්යයට සහභාගී වන සභාවේ නිලධාරීන්ටත් සුදුසු ඇඳුමෙන් පැමිණීම සිදුවිය යුතු බවට අප උපදෙස් ලබා දී ඇති බවත් එමනිසා එම නිල ඇඳුම නිසිආකාරව ඇඳ මේ සභාවේ කටයුතු වලට සහයෝගය දැක්වීම සිදුවිය යුතු යන ඉල්ලීම සිදු කරන බවත් ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයෙන්ම මෙම ඉල්ලීම සිදු කරන බවත් උහන ප්‍රාදේශීය සභාව සමස්ථ නැගෙනහිරටම ආදර්ශයක් බවත් පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති (මූලාසනය)**

ගරු රංජිත් ඒකනායක මන්ත්‍රීතුමා දැනුවත් කරපු කාරණය සත්‍ය බවත් අප විසින් සභාවේ පවත්වාගෙන පැමිණි සම්ප්‍රදායන් ටික ඉදිරියට පවත්වාගෙන යා යුතු බවත් මෙහි වගකීම මා හට ගත නොහැකි බවත් අද දිනයේ තාවකාලිකව සභාව මෙහෙය වීමට පමණක් බැඳී සිටින බවත් ප්‍රකාශ කරන ලදී. සභාපතිතුමා ලේකම්තුමිය හා නිලධාරී මණ්ඩලය මෙහි වගකීම ගත යුතු බව ප්‍රකාශ කරන ලදී. සෙංකෝලය රැගෙන එන නිලධාරිතුමා අත්කොට ඇඳුමින් සැරසී සිටීම පිළිබඳ වගකීම මට ගැනීමට නොහැකි බවත් එය ලේකම්තුමියගේ වගකීමක් බවත් සභාපතිතුමා අද සිටියා නම් එය එතුමාගේ වගකීමක් බවත් පැහැදිළි කරන ලදී. එය දැනුවත් කිරීම පිළිබඳ ඔබතුමාට ස්තුතිවන්ත වන බවත් එය මතක් කර කර කියා සිටීමට අවශ්‍ය නැති බවත් එය සියලු දෙනාගේම වගකීම බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් සභා වාර්තාව ස්ථිර කරන ලදී.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ ඒකමතික කැමැත්ත මත සභා වාර්තාව සම්මත විය.**

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම**

**ගරු උප සභාපති (මූලාසනය)**

පළාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්ය පිළිබඳ දේපළ තක්සේරු කිරීම සම්බන්ධව උපාධිධාරීන් යොදා කටයුතු කිරීමට පළාත් පාලන කොමසාරිස් විසින් අනුමැතිය ලබා දී ඇති ලිපිය සභා ගත කරන ලදී.

அலுவலகம் / කාර්යාලය / Office } 026-2223087

ஆணையாளர் / කොමසාරිස් / Commissioner } 026-2220074

தொலைநகல் / ෆැක්ස් / Fax } 026-2220075

மி-அஞ்சல் / වි-ලිපිනය / E-mail } clg@ep.gov.lk


உள்ளூராட்சித் திணைக்களம்
கிழக்கு மாகாணம்
පළාත් පාලන දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත
DEPARTMENT OF LOCAL GOVERNMENT
EASTERN PROVINCE

எனது இல. / මගේ අංකය / My No. } EP/14/LEGAL/ Uhana P.s/22

உனது இல. / ඔබේ අංකය / Your No. }

Date : 2022.12.09

ප්‍රාදේශීය සභාව
14 DEC 2022
උහන.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
උහන.

<u>පළාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්යය සඳහා දේපළ තක්සේරු කිරිම</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ අංක. UPS/Rev/02/RA/2022 දරණ 2022.10.14 වන දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, මාගේ සමාංක දරණ 2022.05.19 වන දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය හැදෑරු උපාධිධාරින් දෙදෙනා බඳවා ගැනිමට සහා තීරණය ලබාගෙන ඇති බැවින්, තක්සේරු කරයුතු දේපල පිළිබඳව තොරතුරු සමඟ එම උපාධිධාරින්ගෙන් අවශ්‍ය තක්සේරු කටයුතු සිදු කිරිමට හා ඒ සඳහා අවශ්‍ය ගෙවීම් සිදු කිරිමට එකඟතාවය මත එම උපාධිධාරින්ගෙන් සේවය ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධිකරණය වී අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිමට මාගේ අනුමැතිය ලබාදෙන බවත්, නොපමාව අවශ්‍ය කටයුතු සිදු කරගන්නා ලෙසත් ඒ පිළිබඳව මා දැනුවත් කරන ලෙසත් දන්වා සිටිමී.

03. තවද මෙම තනතුරු සඳහා පළාත් පාලන ආයතන තුළ අනුමත සේවක සංඛ්‍යාව නොමැති බැවින්, බඳවා ගැනිම් කටයුතු සිදුකළ නොහැකි අතර මාගේ සමාංක දරණ 2022.05.19 වන දිනැති ලිපිය මඟින් ලබාදී ඇති උපදෙස් අනුව අවශ්‍ය ගෙවීම් සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමී. ( ලිපියේ පිටපත අමුණා ඇත)

N.M

එන්. මනිවන්නන්,
පළාත් පාලන කොමසාරිස්,
නැගෙනහිර පළාත

පිටපත්-


01. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, නැ.ප - කරු.දැ.ස
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, අම්පාර - කරු.දැ.ස.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

වරිපනම් තක්සේරුවට එම නිලධාරීන් පැමිණීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත් මේ සඳහා කාන්තා නිලධාරීන් පැමිණිය හොත් එම නිලධාරීන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා සභාවෙන් වෙනම නිලධාරීන් කොටසක් ලබා දීමට සිදු වන බවත් පිරිමි නිලධාරීන් පැමිණියහොත් එවැනි දෙයක් සිදු කරන්නට උවමනා නොවන බවද පෙන්වා දෙන ලදී. අමතර වැයක් මේ සඳහා දැරීමට සිදුවේවි යැයිද පෙන්වා දෙන ලදී. මෙය ඉක්මනින් කළ යුතු කාර්යයක් බවත් අප ගන්නා ආදායම මේ අයට වැය කරන්නට සිදුවුහොත් ප්‍රතිඵලයක් නොවන බවද පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති (මූලාසනය)**

උහන සති පොළ භූමිය හෝ ඒ අසළ මසුන් වෙළඳාම් කිරීමට අවසර ඉල්ලා ලංකා ධීවර සංස්ථාව, කල්මුණේ කළමණාකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරන ලදී.



ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு
Ministry of Fisheries & Aquatic Resources Development

CEYFISH

දුරකථනය / தொலைபேசி / Telephone: Chairman +94112523689, +94112540455; General +94112523227, +94112523228

ලංකා ධීවර සංස්ථාව
இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்
CEYLON FISHERIES CORPORATION

ෆැක්ස් අංකය / தொலை நகல் / Fax No.: +9411252338

මගේ අංකය / எனது இல. / My No.: CFC/KM/AM
Ceylon Fisheries Corporation Kalmunai

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022/12/14

ප්‍රාදේශීය සභාව
14 DEC 2022
උහන.

ගරු සභාපතිතුමා
ප්‍රාදේශීය සභාව
උහන

සති පොළ බිම හෝ අසල මසුන් වෙළඳාම් කිරීමට අවසර ලබා ගැනීම සම්බන්ධවයි.

ගරු සභාපතිතුමනි.

ධීවර සංස්ථාව වන අප ආයතනය විසින් පාරිභෝගිකයින් හට සේවාවක් සැපයීම සඳහා මෙගම අලුත් කටයුතු සිදු කරනු ලබයි. ඔබතුමන්ගේ ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයිති උහන පොළ ආශ්‍රිත මසුන් ලොරි රථය තුල තබාගෙන අලෙවි කිරීම සඳහා අවසර ලබා දීමට කටයුතු සලසා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මීට විශ්වාසී

Manager
Ceylon Fisheries
Corporation
Kalmunai

නැවිගතයි.

පිටපත්: ජනාධි/ලේ.
අගා/ලේ.
මු. හා කු./ලේ.
ජා.ආ.ම.ආනී. හා සා.ජී/ලේ.
සැ.ක්‍රි.කි/ලේ.
ප.පා. හා ප.ස/ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/08/2311/351/042
ඔබේ අංකය:
2009 ජනවාරි මස 08 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්

**ධීවර සංස්ථා ජංගම මසුන් අලෙවි කටයුතු සඳහා**
**පළාත් පාලන ආයතනවල අවසරය ලබාගැනීම**

(ධීවර හා ජලජ සම්පත් ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2008.12.15 දිනැති සංදේශය)

2008 දෙසැම්බර් මස 23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

ජී.කපන්ගම,
අතිරේක ලේකම්.

අ.කාලේ/වී.විජේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - 2008.12.23 දින පැවැත්වුණු සිය රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව, ලැබී ඇති පරිදි මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ සහ වෙනත් අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ හා වෙනත් නියෝජිත ආයතනවල අදහස් දැක්වීම් සමග සලකාබලා, එම පත්‍රිකාව යටතේ දක්වා ඇති පරිදි තීරණය ගන්නා ලදී:

28. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08/2311/351/042 වූ, "ධීවර සංස්ථා ජංගම, මසුන් අලෙවි කටයුතු සඳහා පළාත් පාලන ආයතනවල අවසරය ලබාගැනීම" යන මැයෙන් ධීවර හා ජලජ සම්පත් ඇමතිතුමා ඉදිරිපත් කළ 2008.12.15 දිනැති සංදේශය - රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ආරක්ෂක නිෂ්කාශනයට යටත්ව, ලංකා ධීවර සංස්ථාවේ ජංගම මසුන් අලෙවි කටයුතු කිසිදු බාධාවකින් තොරව, පවත්වාගෙන යාමට අවසර ලබාදෙන ලෙස සියළුම පළාත් පාලන ආයතන හා පොලිස් ස්ථාන වෙත දැනුම්දීම සඳහා අනුමැතිය දෙන ලදී.

ක්‍රියා කළයුතු: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

පිටපත්: රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
} සංදේශයේ පිටපතක් යානලද ඇත.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස මම සම්පූර්ණයෙන්ම මෙයට විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී. අම්පාර නගරයේත් මේ කටයුත්ත කරන බවත් මෙය නාමික පුවරුවක් බවත් පැහැදිළි කරන ලදී. මේක කරන්නේ පෞද්ගලික කෙනෙක් බවත් පෙන්වා දෙන ලදී. දැනට මාළු කඩ දෙක තුනක් තිබෙන බවත් අපට ඒවා වත්

පාලනය කරගන්නට බැරි වී තිබෙන බවත් අපි හදන්න යන උහන නව සතිපොළ ගොඩනැගිල්ලේ පහල මහලේ කඩ හදන ඒවායින් සුදුසු තැනක් ඒ සඳහා ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. වාහන වල තියාගෙන වෙළඳාම් කරන අය අපි විසින් ඉවත් කරන බවත් ඉතින් මේ අයට පමණක් අවස්ථාව ලබා දෙන්නේ කෙසේද යැයි විමසන ලදී.

**ගරු උප සභාපති (මූලාසනය)**

මෙය ධීවර සංස්ථාවේ අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සම්බන්ධ පත්‍රිකාවක් සමඟ එය එවා ඇති බවත් එයට අකමැති නම් සභාවේ සාකච්ඡා කරපු කරුණු ඔවුන්ට ලබා දෙන්න යැයි ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

මීට අවුරුදු දෙකකට තුනකට පෙරද ධීවර සංස්ථාවේ මාළු අළෙවි කිරීම සඳහා වෙළඳසැලක් ලබා ගැනීමට කටයුතු සොයා බැලූ බවත් එයට සුදුසු ස්ථානයක් නොමැති වීම නිසා එය ටිකක් පස්සට ගිය බවත් ප්‍රකාශ කරන ලදී. ධීවර සංස්ථාව මඟින් වෙළඳකුටියක් ඉදි කරනවානම් ප්‍රදේශයේ ජනතාවට සාධාරණ මිලට නැවුම් මාළු ලබා ගැනීමට හැකි වන බවත් දැන් සිතූ සිතූ ලෙස මිළ ගණන් වලට මාළු අලෙවි වන බවත් පෙන්වා දෙන ලදී. සභාවක් ලෙස වෙළෙන්දන් දෙසම විතරක් නොබලා ප්‍රදේශයේ ජනතාවට සහනයක් වන දේ බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මෙතෙක් කාලයකට ධීවර සංස්ථාවෙන් උහන ප්‍රදේශයේ මාළු අළෙවි වීමක් සිදු නොවුනු බවත් එසේම මෙච්චර මුහුද ළඟ තබාගෙන ධීවර සංස්ථාව හරහා නැවුම් මාළු ලබා ගැනීමට අපට හැකියාවක් ලැබී නැති බවත් එමනිසා මෙවැනි අවස්ථාවක් උදාවීම ඉතාමත් හොඳ බව ප්‍රකාශ කරන ලදී. එමනිසා පාරිභෝගික ජනතාවට විශාල සහනයක් වන නිසා අපේ අනුමැතිය මේ සඳහා ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා**

දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ අදහස ඉතා හොඳ බවත් නමුත් දැනට මාළු විකුණන වෙළෙන්දන් මාළු ටික විකුණන්නේ ඉතාම අපහසුවෙන් බව පෙන්වා දෙන ලදී. එසේම තනි පුද්ගලයෙකු ලෙස පැමිණ මාළු විකුණනවානම් අසාධාරණ බවත් එසේ නොවී ධීවර සංස්ථාවෙන් මාළු විකුණනවානම් එය ප්‍රශ්නයක් නොවන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු උප සභාපති (මූලාසනය)**

අමාත්‍ය මණ්ඩල තීරණයේ පත්‍රිකාවක්ද අමුණා ඇති බවට දෙලංකාවල මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටිය අදහස් වල සත්‍යක් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එදා දවසේ අලුත් මාළු ගමට එනවා කියන්නේ හොඳ දෙයක් බවත් අලුත් මාළු සාධාරණ මිලකට ලබා ගැනීමට හැකි වීම ජනතාවට යම් සහනයක් බවත් පෙන්වා දෙන ලදි. උපරිම මිලකට නොයා සාමාන්‍ය මිලකට මාළු මිල පවත්වා ගෙන යා හැකි බවද පෙන්වා දෙන ලදි. ධීවර සංස්ථාවෙන් මාළු විකිණීමේ දී පාලන මිලකට මාළු ලබා ගැනීමට හැකි වන බවද පෙන්වා දෙන ලදි. සභාවේ වෙළෙන්දන් ගැනද අපි බැලිය යුතු බවත් නමුත් සභාවේ කාර්ය භාර්ය විය යුත්තේ මහජනතාවට හොඳ දේ ලබා දීම බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

අම්පාර ස.තො.ස ළඟ ධීවර සංස්ථාවෙන් කියා මාළු විකුණන බවත් ඒක පුද්ගලික කෙනෙක් කරන බවත් අපි හිතන තරම් සහනයක් පාරිභෝගිකයාට සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී දර්ශන නුවන් විශ්ණුදේව මයා**

රංජිත් මන්ත්‍රීතුමා පැවසූ අම්පාර ස.තො.ස. කාරණාව ඇත්ත බවත් ධීවර සංස්ථාවෙන් මෙය කරනවා නම් හොඳ බවත් යම් කොන්දේසි ටිකක් අප විසින් යොදා ඒ කොන්දේසි මත මෙයට අනුමැතියක් ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. සභාවේ අධීක්ෂණය යටතේ මෙය සිදු විය යුතු බව පෙන්වා ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්. රාණි මැණිකේ මිය**

ධීවර සංස්ථාවෙන් ලොරි රථයක් තුළ මාළු විකිණීමට අනුමැතිය ඉල්ලා ඇති බවත් දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට පාරභෝගිකයාට යහපත් දේ සිදු විය යුතු බවත් දැන් මේ උහන නගරයේ මාළු මිල ඉතා අධික බවත් කල්මුණේ ගොස් අපි මාළු අඩු මිලට රැගෙන එන බවත් ප්‍රකාශ කරන ලදි. ධීවර සංස්ථාව විසින් වෙළදාම උහන නගරයේ සිදු කළ හොත් තරඟයක් ඇති විය හැකි බවත් ඒ තුළින් පාරිභෝගිකයාට සහනයක් ලැබිය හැකි බවත් පෙන්වා දෙන ලදි. ධීවර සංස්ථාවේ අනුමත මිලට අපට මාළු ලබා ගැනීමට හැකියාව ඇති බවත් ප්‍රකාරශ කරන ලදි. එසේ ධීවර සංස්ථාවේ මිල ගණන් වලට මාළු අලෙවි කිරීම සිදු වෙනවා නම් මාගේ එකඟතාවය මේ සඳහා ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

මාළු මිල ගණන් දිනපතාම ධීවර සංස්ථාවෙන් තීරණය නොවන බවත් කොළඹ අවට නම් එය සිදු වන බවත් මාළු කොළඹින් නොව කල්මුණෙන් ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදි. කල්මුණේ රු.800.00 ට මාළු කිලෝ එකක් අළෙවි වෙනවා නම් රු. 1400.00 කට වගේ මෙහේ විකුණන බවත් ,ෆුට්සිටි වල පමණක් පිටින් මාළු ගෙන එන බවත් පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා**

ධීවර සංස්ථාව යටතේ මේ ක්‍රියාව සිදු වනවා නම් ඉතාම හොඳ වැඩ පිළිවෙළක් බවත් මේ දිනවල සාලයෝ කිලෝ එක කල්මුණේ නගරයේ රු.70-100 ත් අතර විකිණෙන බවත් නමුත් උහන නගරයේ රු.400.00 ක් වැනි මිලකට ඒවා අළෙවි කරන බවත් පෙන්වා දෙන ලදි. එම නිසා ධීවර සංස්ථාවේ නියාමනයෙන් මේ කටයුත්ත සිදුවනවා නම් පාරිභෝගිකයාට යම් සහනයක් ලැබිය හැකි බව ප්‍රකාශ කරන ලදි. මාළු පිළිබඳ වෙන යම් යම් සෞඛ්‍ය ගැටලු වලට පවා ධීවර සංස්ථාවෙන් විසඳුම් ලැබෙන බවත් ජනතාවට යම් සුභසාධනයක් වනවා නම් මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති (මූලාසනය)**

ඉතාමත් හොඳ අදහස් මන්ත්‍රීවරු ප්‍රකාශ කරන බවත් මෙය උහන නගරයේ පමණක් මාළු අළෙවි කිරීම බවත් පැහැදිලි කරන ලදි. අපේ බල ප්‍රදේශයේ වෙළෙන්දන්ගෙන් ලැබෙන වරිපනම් හෝ කඩ ගාස්තු වලින් සභාව පවත්වා ගෙන යන බවත් ඒ ආකාරයටම ධීවර සංස්ථාවෙන් යම් මුදලක් අය කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදි. පිටින් කවුරු පැමිණියත් අපේ තිබෙන කොන්දේසි වලට පිටින් යා නොහැකි බව පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

ඔබතුමාලා මොන තීන්දුව ගත්තත් මේ සම්බන්ධව මාගේ සංම්පූර්ණ විරෝධය පළ කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්. ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා**

අමාත්‍ය මණ්ඩල තීන්දුව ජංගම වෙළඳාම ලෙස අනුමැතිය ලබා දී ඇති බැවින් ස්ථාන ගත නොකර ප්‍රදේශයේම ජංගම වෙළඳාම සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. උහනට පමණක් පොදු කිරීම සිදු නොවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා**

ජංගම සේවය කියූ විට උහන නගරයේ මාළු විකුණලා ඉතිරි ටික ජංගම වෙළඳාම ලෙස සිදු කරාවි යැයිද ප්‍රකාශ කරන ලදි. මම දකින ආකාරයට මාළු වෙළෙන්දන් ඉතා අපහසුවෙන් මාළු විකුණන බවත් අලුත් මාළු කෑමට  ලැබෙන එක ජනතාවට සහනයක් වුවාට මාළු වෙළඳාම ඉතා අපහසුවෙන් කරන බව ප්‍රකාශ කරන ලදි. දෙලංකාවල මන්ත්‍රීතුමාගේ කතාවට එකඟ නමුත් වෙළෙන්දන් ගැනද සිතිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ දෙලංකාවල මයා**

සිසිර මන්ත්‍රීතුමා පවසන ආකාරයට ඉතාම අපහසුවෙන් වෙළඳාම කරන නිසා මෙය සුදුසු නෑ කියන අදහසක් ගම්‍ය වන බවත් ඇත්තටම මම වෙළෙන්දන්ට විරුද්ධව කතා කිරීමක් නොවන බවත් අපට ඉතාම හිතවත් කණ්ඩායමක් ඔතන වෙළඳාම කරන බවත් නමුත් බොහොම කලාතුරකින් යම් ප්‍රදේශයකට ධීවර සංස්ථාව හරහා මාළු බෙදා හැරීම සිදු වන බවත් ඒ නිසා අපට ලැබෙන මේ පළමු අවස්ථාව බවත් පැහැදිලි කරන ලදි. මීට පෙර අවුරුදු 03කට පමණ ඉහත දී අප උත්සහයක් ගත් නමුත් එම අවස්ථාව අපට ගිලිහී ගිය බවත් ඔවුන් එම අවස්ථාවේදී ඉල්ලා සිටියේ ස්ථිර ස්ථානයක් ලබා දෙන ලෙස බවත් එහෙම ස්ථානයක් අපට ලබා දීමට හැකියාව නොමැති වීම නිසා එක ගිලිහී ගිය බව ප්‍රකාශ කරන ලදි. ඔබතුමා කියන ආකාරයට වෙළෙන්දන් ඉතාම අමාරුවෙන් වෙළඳාම කරගෙන යනවා කියන එක පිළිගන්නට පුලුවන් බවත් එසේවන්නේ අධික මිල ගණන් යටතේ විකුණන්නට උත්සහ කරන නිසා බව පෙන්වා දෙන ලදි. එසේ නොවී සාමාන්‍ය සාධාරණ මිලකට අළෙවිය සිදුවනවා නම් එය විකිණීම අපහසු නොවන බව පෙන්වා දෙන ලදි. මිනිස්සු මාළු කෑමට ආසයි, මාළු මිල වැඩි නිසා මිලදී නොගෙන යන බවත් සාධාරණ මිලට විකුණනවා නම් ඉතා ඉක්මණින් මාළු අළෙවි වන බව ප්‍රකාශ කරන ලදි. ධීවර සංස්ථාවෙන් මාළු විකුණන්න ගත් ගමන් විශාල සහනයක් ලැබෙනවා යැයි මා නොසිතන බවත් නමුත් තරඟකාරිත්වයක් ඇති වීම තුලින් යම් සහනයක් ලැබෙන බවත් වෙළඳ පොළ තුල තිබෙන මිලට මෙහේ මාළු අලෙවි කිරීමට ගත් විට තරඟකාරීත්වයක් ඇති වී මාළු මිල අඩුවිය හැකි බව පෙන්වා දෙන ලදි. එම නිසා ප්‍රදේශයේ **ජනතාවට** අඩු මිලට මාළු ටිකක් කන්න ලැබෙයි යැයි මාගේ අදහස බව පැහැදිලි කරන ලදි. අපට මේ ලැබුණු පළමු අවස්ථාවෙන් එල ප්‍රයෝජනයක් ගැනීම සුදුසු බව මාගේ  අදහස බවත් වෙළෙන්දන්ට පහර ගසා සභාව ජනතාව ගැන සිතනවා කියන එක නොසිතා ඒ වෙළෙන්දන්ට ඒ වෙළඳාම කර ගන්නට ඉඩ තබා කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති (මූලාසනය)**

මෙය නිවේදන යටතේ සභාවට ඉදිරිපත් කලාට , මෙය යෝජනාවක් ලෙස ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස රංජිත් ඒකනායක මන්ත්‍රීතුමා මෙයට ප්‍රබල ලෙස විරුද්ධ වන බවත් වැඩි අයගේ අදහස වූයේ මහජනතාවට හොඳ දේ දීමට ක්‍රියාත්මක විය යුතු බවයි. මෙය නිවේදන යටතේ ඉදිරිපත් කිරීම නිසා මේ සඳහා ඡන්දයක් විමසීමට නොහැකි බව පෙන්වා දෙන ලදි. මෙයට එකඟතාවයකට ඒමට නොහැකි නිසා යෝජනාවක් ලෙස මෙය ඉදිරිපත් කරනවා දැයි විමසන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා**

මේ ලිපිය පිළිබඳ ගැටළුවක් පවතින බවත් අමාත්‍ය මණ්ඩල තීන්දු තීරණ මුද්‍රණය කරපු ලිපියේ තිබෙන බවත් මේ ලිපිය අතින් ලියා අති බවත් ධීවර සංස්ථාවෙන් මේ ලිපිය ඉදිරිපත් කරා නම් මීට වඩා විධිමත්ව මෙය එවන බව පෙන්වා දෙන ලදි. නිල මුද්‍රාව තබා තිබුණාට සංස්ථාවකින් ලිපියක් යොමු කරනවාට වඩා වෙනසක් තිබෙන බව පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්පකුමාර මයා**

මෙම කාරණය කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කර ඇති බවත් නමුත් මේ ලිපිය කළමණාකරු විසින් අතින් ලියා අත්සන් කර ඇති බවත් මෙය ගැන විශ්වාසයක් නැති බවත් මෙහි ක්‍රමවේදයක් නැති බවත් අමාත්‍ය මණ්ඩලයෙන් මෙවැනි ක්‍රමවේදයකට මුලු රටේම ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කර අති බවත් නමුත් එම යෝජනාව අනුව සාධනීය කරුණු මෙයට ඉදිරිපත් කර නැති බවත්, ජංගම වෙළඳ රථයක් ලෙස සඳහන් වී ඇති බවත් මේ ජංගම වෙළඳ රථය ධීවර සංස්ථාවෙන් එනවාද යන්න සඳහනක් නැති බවත් ප්‍රකාශ කරන ලදි. ජංගම වෙළඳ රථයෙන් අපට නැවුම් මාළු ලැබෙනවාද අපට කුණු මාළු ලැබෙනවාද යන්න නොදන්නා බවත් නමුත් අපි නිතරම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිට ගත යුතු බවත් අපි මිනිස්සුන්ට හොඳ දේවල් දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. ඒ කෙසේ නමුත් මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් පෙනී සිටිය යුතු බව පැහැදිලි කරන ලදි. ප්‍රදේශයේ මන්ත්‍රීවරු ලෙස ප්‍රදේශයේ වෙළදාම ගැන ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරිකයා ගැන ප්‍රදේශයේ ජනතාව ගැන පෙනී සිටිය යුතු බව පෙන්වා දෙන ලදි. නැවුම් හොඳ දේවල් ලබා දිය යුතු බවත් නමුත් මෙය ක්‍රියාත්මක වන විට ධීවර සංස්ථාවේ නාම පුවරුව ගසා ගෙන පෞද්ගලික මනුස්සයෙක් මාළු විකුණුවොත් අපි ඉන් පසු ගන්නා තීරණය කුමක්ද යන්න විමසන ලදි. මේ ප්‍රදේශයේ සිටින වෙළඳ ව්‍යාපාරිකයාව අපි කරන්න පුළුවන් උපරිම ද්‍රෝහිකම සිදුකර ඇති බවත්, එවිට මෙම සංස්ථාව රජයේ ආයතනයක් බවත් ,රජයේ එම ආයතනය ගැනට වඩා අපේ ජනතාව ගැන සිතා තීන්දුවක් ගතයුතු බව පැහැදිලි කරන ලදි.දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ අදහසට අකමැති වනවා නොවන බවත් , නමුත් අපේ අනුමැතිය ලබාදුන් පසු කෙසේ ක්‍රියාත්මක වනවාදැයි නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.ධීවර සංස්ථාවේ ලෙටර් හෙඩ් එක තිබෙන නමුත් මේ ලිපිය ලියා ඇත්තේ අතින් බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ දෙලංකාවල මයා**

මේ ලිපියේ නිල මුද්‍රව හා අත්සන තිබෙන බවත් , එය අතින්ද ලියුවේ , මුද්‍රණය කරලාද තිබෙන්නේ යන්න සොයා බැලීම විහිළුවක් බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති (මූලාසනය)**

මුලින්ම ධීවර සංස්ථාවට මේ ලිපිය විධිමත් ආකාරයට යොමු කරන ලෙස ලිඛිතව ලිපියක් යොමු කරන ලෙසත් එය අපි යෝජනාවක් ලෙස සභාවට ඉදිරිපත් කරමු යැයි ප්‍රකාශ කරන ලදි.සභාවේ සියළු මන්ත්‍රීවරුන්ට එවිට අදහස් දැක්විය හැකි බවත් එවිට වැඩි දෙනාගේ කැමැත්ත මත එයට අවසර දිය හැකි බව ප්‍රකාශ කරන ලදි. අපේ කොන්දේසිත් යොදා ලිපිය යැවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

ජංගම වෙළදාමට අවසර දුන්විට , උභන නගරයේ පමණක්ද , නොමැතිනම් මේ බල ප්‍රදේශයේම ජංගම වෙළදාම සිදු කරනවාද යන්න විමසිය යුතු බවත් , සභාවේ කඩ කාමරයක් රැගෙන වෙළදාම සිදු කරන ලෙස ප්‍රකාශ කල හැකි බව පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ දෙලංකාවල මයා.**

අපි ලිපිය යවන විට අපි විසින් ප්‍රශ්න ටිකක් විමසා යැවිය යුතු බවත් , ඔබතුමාලා කරන්නට බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයට ද , අපේ කඩ කාමරයක් ලබා දුන්නොත් එහි වෙළදාම කල හැකිද , ප්‍රදේශය පුරා ජංගම වෙළදාමක් ලෙස වෙළදාම කරනවාද ,අපට නැවුම් මාළු ලැබෙනවාද , ධීවර සංස්ථාවේ අනුමත මිල ගණන් වලට අලෙවි කරනවාද , යනුවෙන් ප්‍රශ්න විමසා ලිපිය යැවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින්ද පුෂ්ප කුමාර මයා.**

අපි දැනට පවත්වාගෙන යන පොළ භූමියේ සීමිත ඉඩකඩ ප්‍රමාණයක් තිබෙන නිසා මෙයට අනුමැතිය දීම අපහසු බවත් ,ප්‍රදේශයේ වෙළද ව්‍යාපාරිකයින් පවා පාරවල් දිගේ වෙළදාම සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදි. අපි පොළ භූමිය ස්ථිර ස්ථානයකට රැගෙන යන බවත් එම අවස්ථාවේදී ස්ථිර ස්ථානයක් ලබාදිය හැකි බව දන්වා ලිපිය යවන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

මන්ත්‍රීවරු දැක්වූ අදහස්වල සාරාංශය අරගෙන කොන්දේසි ටිකක් ඇතුලත් කර ලිපියක් යවන්න යැයි ලේකම්තුමියට උපදෙස් දෙන ලදි.එසේ යවන ලිපියට පිළිතුරු ලෙස ලැබෙන ලිපිය සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත්කර අනුමැතිය ලබා ගැනීම සිදු කරමු යැයි ප්‍රකාශ කරන ලදි.ඉදිකිරීමට යෝජිත නව වෙළද පොළෙන් කඩ කාමරයක් ලබා දීමට හැකි බවත් දන්වා යවන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

උහන සේනානායක මාවත උහන කනිටු විදුහල ඉදිරිපිට ඇති මාර්ගය එක් දිශාවකට ගමන් කිරීමේ මාර්ගයක් කිරීම පිළිබදව කරුණු දක්වා උහන පොලිස් ස්ථානාධිපති විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.

මගේ අංකය:- 5664/2022
පොලිස් ස්ථානය,
උහන.
2022.12.08 දින.

ප්‍රාදේශීය සභාව
DEC 2022
උහන.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
උහන.

<u>**උහන සේනානායක මාවත උහන කනිටු විදුහල ඉදිරිපිටින් ඇති මාර්ගය එක් දිශාවකට ගමන් කිරිමේ මාර්ගයක් කිරිම (one way)**</u>

උක්ත මාර්ගය එක් දිසාවකට ගමන් කිරිමේ මාර්ගයක් (one way) කරදෙන ලෙසට ඉල්ලා සිටිමින් උහන වෙළෙද හා කර්මාන්ත හිමියන්ගේ සුභසාධක සංගමය විසින් මා වෙතද පිටපතක් සහිතව ඔබ වෙත යොමුකර ඇති 2022.11.02 දිනැති ලිපිය හා බැදේ.

උක්ත ලිපියෙන් ඉල්ලා ඇති පරිදි උහන කනිටු විදුහල ඉදිරිපිටින් ඇති ප්‍රධාන මාර්ගය එක් දිසාවකට ගමන් කිරිමේ මාර්ගයක් (one way) කිරිමට ඇති හැකියාව සම්බන්ධයෙන් ස්ථානයේ රථවාහන අංශයේ ස්ථානාධිපති සමග මා විසින් නිරීක්ෂණය කලෙමි. එහිදී මෙම මාර්ගය එක් දිසාවකට ගමන් කිරිමේ මාර්ගයක් බවට පත් කිරිමේදී වීරගොඩ දෙස සිට එන වාහන උහන MOH කාර්යාලය අසලින් ඇති මාර්ගයෙන් වාහන හරවා එවීමට සිදුවේ. එසේ වාහන හරවා එවීමේදී උහන කනිටු විදුහලට ළමුන් රැගෙන එන වාහන,යතුරුපැදි සියල්ල එසේ හරවා එවීමේදී එම වාහන උහන පොලිසිය ඉදිරිපිටින් ඇති අම්පාර මහනුවර ප්‍රධාන මාර්ගයට පිවිස නැවත දකුණු පසට ප්‍රධාන මාර්ගයේ මීටර් 50 ක් පමණ ගමන් කර නැවත දකුණු පසට ඇති සේනානායක මාවතට ප්‍රවේශවී ගමන් කිරීමට සිදුවේ. එය පාසැල් ළමුන් රැගෙන එන වාහන වලට මෙන්ම අනෙකුත් වාහන අනතුරකට ලක්වීමේ හැකියාවක් ඇති බවට නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම වෙළෙද සංගමයේ ඉල්ලිමට අනුව උක්ත මාර්ගය එක් දිසාවකට ගමන් කිරිමේ මාර්ගයක් කිරීම සුදුසු නොවන බවට නිරීක්ෂණය කලෙමි.

මේ සම්බන්ධයෙන් විකල්පයක් පිළිබදව අධ්‍යනය කල අතර ඒ අනුව උහන කනිටු විදුහෙලේ ප්‍රධාන ගේට්ටුව ඉදිරිපිට වංගුව සහිත මාර්ගය දෙපස පිහිටීම වෙනස් කල යුතුව ඇති බවට නිරීක්ෂණය කලෙමි. ඒ අනුව මාර්ගය දෙපස ඉතාමත් බෑවුම් සහිත බැවින් මාර්ගයෙන් ගමන් ගන්නා වාහන දෙපසට මාරුවීමේදී කිසි සේත් මාර්ගයෙන් ඉවත් කර ගැනීමක් සිදු නොවන අතර මෙම මාර්ගය දෙපස පස් පුරවා ඉඩ ප්‍රමාණය පුළුල් කිරීමෙන් මෙම තත්වය මග හරවා ගැනීමට හැකියාව ඇති බව ඔබ තුමිය වෙත වාර්තා කරමි.

ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,

එම්.[illegible] ගුණවර්ධන
පොලිස් පරීක්ෂක
වැඩ බලන ස්ථානාධිපති
ස්ථානාධිපති විවිධ පැමිණිලි

පිටපත:- ගොනුවට.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

මෙය සත්‍ය තත්වය බවත් , ඒ පිළිබදව එතුමාට ස්තුතිය පුදකරන බවත් මේ ලිපියේ මාර්ගය දෙපස පස් පිරවීම සම්බන්ධව සදහන් වන බවත් , එය සභාවක් ලෙස අපට කළහැකි කාර්යයක් නොවන බවත් , මේ නිර්දේශ ටික මහාමාර්ග දෙපාර්තමේන්තුවට යැවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

මෙම කාරණය සම්බන්ධව මහාමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කලපසු මහාමාර්ග දෙපාර්තමේන්තුවෙන් මෙම පාරේ රක්ෂිතය ලබාගෙන කටයුතු කරාවි යැයි ප්‍රකාශ කරන ලදි.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා සභාවට ඉදිරිපත් කිරීම**

**යෝජනා අංක 06/2022/12(01)**

ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය මහතා විසින්, 2022 වර්ෂයේ ගිණුම් පියවීම සහ අවසන් ගිණුම සැකසීම සඳහා පහත සඳහන් නිලධාරීන් හට 2022 වර්ෂයේ දෙසැම්බර් මස සිට 2023 වර්ෂයේ පෙබරවාරි මස දක්වා පැය 40 ක අතිකාල දීමනා ලබා දීම සඳහා සභාවේ අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

| නම | තනතුර |
|---|---|
| පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් |
| ඩබ්.එස්.ආර්. කුමාරි මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි |
| එස්.එස්. කුසුමලතා මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| ඩබ්. දිලානි මහේෂිකා මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| යූ.පී.ඩී. උබේසිංහ මිය | සංවර්ධන නිලධාරි |
| කේ.එම්.ඩබ්.එම්. රූපසිංහ මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| සෞම්‍යා ශ්‍රී ප්‍රභානි මිය | සංවර්ධන නිලධාරි |
| කේ.එම්.එස්. සුධාරි සේමරත්න මිය | සංවර්ධන නිලධාරි |
| වයි.ඒ. සුනේත්‍රා දමයන්ති මිය | සංවර්ධන නිලධාරි |

කාර්යාල අභ්‍යන්තර කළමනාකරණය සඳහා අවශ්‍ය කාර්යයන් සිදු කිරීම, හා ඵලදායිතාවය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට කාර්යාලයේ පහත තනතුරු දරණ නිලධාරීන් සඳහා පැය 40 ක අතිකාල දීමනා ලබා දීමට සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

I. සංවර්ධන නිලධාරී
II. කළමනාකරණ සේවා නිලධාරි

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

සභාපතිතුමාගේ අනුමැතියෙන් අතිකාල දීමනා පැය 20 ක් ලබා දිය හැකි බවත් ,ඉන් එහාට යන්න පැය 40 ක් අතිකාල දීමනා ඉල්ලා ඇති බවත් , දෙසැම්බර් 31 වන විට ගිනුම් කටයුතු අවසන් කරන නිසා 2023 පෙබරවාරි දක්වා ඉල්ලා සිටින්නේ කුමන හේතුවක් නිසාදැයි විමසන ලදි.පැය 20 අතිකාල දෙමු යැයිද ප්‍රකාශ කරන ලදි.රටේ දැන් තිබෙන තත්වය අනුව අතිකාල පැය 40 කට යෑම උචිත නැති බව ප්‍රකාශ කරන

ලදි.කැපකිරීම් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.පැය 40 ගෙවීම සම්බන්ධව මාගේ කැමැත්තක් නැති බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මයා.**

මීට පෙර අතිකාල ලබා දීමේදී අපි සේවකයන්ගේ පැත්තේ සිට හඬක් නගා අතිකාල දීමනා ලබා දීමට කටයුතු කල බවත් , නමුත් මෙතෙක් කල් උවමනාවෙන් වැඩක් කලේ නැහැ කියන මතයක අපි සිටින බවත් , එමනිසා අතිකාල ඉල්ලන්න තරම් තමන් අධක්ෂ්‍යා නොවිය යුතු බවත්,අතිකාල ලබා ගන්නේ නැතිව තමන්ගේ රාජකාරිමය කාර්යයන් කරන්නට හැකි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.මේ රටේ තිබෙන තත්වයන් සමග තමන් කැපකිරීම් කරන ලෙස නොයෙක් ඉල්ලීම් පැමිනෙන බවත් , විශේෂ රාජකාරියක් ඇග වෙහෙසලා ලෙස කරානම් , වෙසක් කලාපය වගේ වැඩසටහන් කලා නම්, අතිකාල දීමනා ගෙව්වාට ප්‍රශ්නයක් නැති බවත් ,මේක හැමදාම කරන්නට ඕන , නිළධාරියාට පැවරිලා තිබෙන රාජකාරියක් බවත් , එය එම නිළධාරියා සිදුකලයුතු බවත් ප්‍රකාශ කරන ලදි. තමන්ට අදාල රාජකාරිය කරගන්න බැරිව මේ කාලයේ හැටියට අතිකාල ඉල්ලනවානම් එය සුදුසු නැති බව ප්‍රකාශ කරන ලදි.සභාපතිවරයාට දෙන්න පුළුවන් කියා අතිකාල පැය 20 වත් දීම මම නම් අනුමත නොකරන බව ප්‍රකාශ කරන ලදි.මෙය තරහට ප්‍රකාශ කිරීමක් නොවන බවත් , මීට කලින් අතිකාල ලබා දීම අපි අනුමත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.මෙවැනි මොහොතක , රට කඩා වැටිලා තිබෙන මොහොතක , නිළධාරීන්ට තමන්ගේ රාජකාරිය කරගන්න බැරිව අතිකාල ඉල්ලා සිටිනවානම් එය නොගැලපෙන බව ප්‍රකාශ කරන ලදි.අපි වැඩ කරන්න ඕන කාලයේ කරන්නට ඕන රාජකාරියේදී අපේ නොහැකියාව පෙන්වා අතිකාල ඉල්ලීම සුදුසු නැති බව ප්‍රකාශ කරන ලදි.නිළධාරීන් මා සමග අමනාප නොවිය යුතු බවත් , සභාවේ මුදල් ඉතිරිකර ගත යුතු කාලයක් බැවින් මෙසේ ප්‍රකාශ කරන බව පැහැදිලි කරන ලදි. මම නම් අතිකාල පැය 20 වත් ගෙවනවාට අකමැති බව ප්‍රකාශ කරන ලදි.

**ගරුඋපසභාපතිතුමා.(මූලාසනය )**

රංජිත් මන්ත්‍රීතුමා හා දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ අදහස් සමග මා එකඟ බවත් රටේ ලොකු ප්‍රශ්නයක් ඇති බවත් ප්‍රකාශ කරන ලදි.මන්ත්‍රීවරු පමණක් මේ සම්බන්ධව අදහස් දැක්වීම සුදුසු නොවන බවත් , නිළධාරීන් වෙනුවෙන් ලේකම්තුමියටත් යම් අදහසක් ප්‍රකාශ කරන්නට මහා සභාව කාරක සභා අවස්ථාවක් කර අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එම්.කුලතුංග මහතාගේ හා ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.15 මහා සභාව කාරක සභාවක් බවට පත්විය .

ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. ජයතිලක මහතාගේ හා ගරු ප්‍රා.ස. මන්ත්‍රීනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.25 කාරක සභාව මහා සභාවක් බවට පත්විය.

**ඒ අනුව 06/2022/12(01) අංක දරණ යෝජනාව සම්බන්ධයෙන්, සභාපතිතුමාගේ අනුමැතියෙන් ලබාදෙන අතිකාල පැය 20 පමණක් ගෙවීම සුදුසු බව තීරණය විය. ඒ තීරණය සඳහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/12 (02)**

ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය මහතා විසින්, ආදේශක පදනම මත ඩෙංගු හා ජලභීතිකා මර්ධන වැඩසටහන සඳහා කම්කරු ලෙස කටයුතු කරන ඒ.ජී. ප්‍රදීප් පද්මචන්ද්‍ර මහතාගේ සේවා කාලය 2023.02.21 දිනෙන් හා ගල්රෝල යන්ත්‍ර ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.ආර්.ජී.ඩී.සී. බණ්ඩාර මහතාගේ

සේවා කාලය 2023.02.15 දිනෙන් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර ක්‍රියාකරු ලෙස සේවය කරන ඩී.එම්. දිලාන් තනුජ දිසානයක මහතාගේ සේවා කාලය 2023.03.27 දිනෙන් අවසන් වන බැවින් මොවුන්ගේ සේවා කාලය මාස 06 කින් දීර්ඝ කිරීම සඳහා සභාවේ අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/12(03)**

ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය මහතා විසින්, උහන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කර ගැනීමට සභාවේ අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| 01.ඩී.එම්. තිලකාවතී මිය | - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, අම්පාර | - සභාපති |
| 02. ඩබ්. දිලානි මහේෂිකා මිය | - ප්‍රාදේශීය සභාව, උහන | - සාමාජික |
| 03. එච්. පද්මශ්‍රියා දිලිකා විරාජනි මිය | - කලාප අධ්‍යාපන කාර්යාලය, උහන | - සාමාජික |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්.කුලතුංග මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/12(04)**

ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය මහතා විසින්, කාර්යාලයේ සේවකයින්ගේ පවතින පුරප්පාඩු මත හා හදිසි අවශ්‍යතාවයන් මත සේවකයින් අමතර රාජකාරි වල යෙදවීමට සිදුවන බැවින් එම සේවකයින් සඳහා 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා අදාල අතිකාල සීමාවක් අනුව බලයලත් නිලධාරියා වෙතින් අනුමැතිය ලබාගෙන අතිකාල දීමනා ගෙවීමට කටයුතු කිරීමට සභාවේ අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| 01. මුරකරුවන් | - පැය 100 |
| 02. මුරකරු තනතුරේ රාජකාරි ආවරණය කරන කම්කරුවන් සඳහා | - පැය 90 |
| 03. කම්කරුවන් හා විදුලි කාර්මිකයින් සඳහා | - පැය 60 |
| 04. රියදුරු සඳහා | - පැය 120 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් ස්ථිර කරන ලදි.**

**ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.10 තේ විවේකය සඳහා සභාව කල් තබන ලදි**

**ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.35 තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මෙම යෝජනාවේ මුර කරුවන් සඳහා පැය 100 ඉල්ලා සිටින්නේ අවුරුද්දටම පැය 100 ක්ද නොමැති නම් මාසයකට පැය 100 ක්ද යන්න පැහැදිලි නොමැති බවත් එය පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදි .මුර කරුවන් කීදෙනෙක් සිටිනවාද? මුරකරු රාජකාරි ආවරණය කරන කීදෙනෙක් සිටිනවාද ? එක් අයෙකුට මසකට පැය 90 ක්ද? දෙදෙනෙකු සිටිනවානම් පැය 90 දෙකට බෙදා ලබා ගන්නවාද ?යන්න පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.කම්කරුවන් කීයක් සිටිනවාද යන්න පැහැදිලි කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.මේ කරුණු විදිමත්ව ලබා දීමට දැන් හැකියාවක් තිබෙනවානම් ලබා දෙන ලෙසත් එසේ නොහැකි නම් ලබන සභා වාරයට මෙම යෝජනාව ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

**ගරුඋපසභාපතිතුමා.(මූලාසනය )**

මුරකරුවන් කීයද? ඔවුන් කවුද ? මුරකරු තනතුරේ රාජකාරි ආවරණය කරන කම්කරුවන් කීයද ? ඔවුන් කවුද? කම්කරුවන් හා විදුලි කාර්මිකයන් කීයද ? ඔවුන් කවුද ? රියදුරන් කීයද ? ඔවුන් කවුද? යන්න නිවැරදිව මෙම සභාවට ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමියට ප්‍රකාශ කරන ලදි. ලැබුණු තොරතුරු අනුව මුරකරුවන් 01. මුරකරු තනතුරේ රාජකාරි ආවරණය කරන කම්කරුවන් 02 යි .කම්කරුවන් හා විදුලි කාර්මිකයන් 09 යි. රියදුරන් 04 යි. බව ප්‍රකාශ කරන ලදි.

.

**ඉහතින් සදහන් කල තනතුරුවල එම ප්‍රමාණයට පමණක් යෝජනාවේ සදහන් මසකට අදාල පැය ගණන ගෙවීමට තීරණය විය .**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/12(05)**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මහතා විසින්, 11/08 ප්‍රකාරව ගෙන එනු ලබන හදිසි යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම

ප්‍රාදේශීය සභාව
15 DEC 2022
උහන.

LHK දයාතිලක (ප්‍රා.ස.මන්ත්‍රී)
34/11b
රජගලතැන්න
2022.12.15

සභාපතිගේ රැස්වීම
2022/12/11 පැවැත්වෙන සභා රැස්වීමට
ඉදිරිපත් කරන්න

ගරු සභාපතිතුමා මගින්
ලේකම් තුමිය
ප්‍රා.ස. උහන

රීති 11/8 යටතේ ඉදිරිපත් කරන යෝජනා

උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදායම් උත්පාදන යෝජනාවක් ලෙස රජගල පුරා විද්‍යා ස්ථානය සංවර්ධනය හා සංචාරකයන්ට පහසුකම් සැලසීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇතත් මේ වන තුරු එය ක්‍රියාත්මක නොවූ බැවින් පුරා විද්‍යා ස්ථානයේ කටයුතු වල ක්‍රියා කරවා කටයුතු කර එවාටින් ඉවත් වූ තවත් මෙම පුරා විද්‍යා ස්ථානය තුල වාහන ලක් ඉදිකිරීම හා ඒ තුලින් සංචාරකයන්ට පහසුකම් සැලසීම යටතේ ඉදිරි කටයුතු කර ආදායම් උත්පාදන කාර්යයක ඇති කිරීමට සුදානමක් ඇත් නම් මා මෙය දැන ගැනීම ලෙස ඇත. මේ සඳහා ප්‍රදේශයේ බහු සංස්කෘතියේ හා ජනතාවගේ දැඩි විරෝධයක් පවතින අතර මෙ කටයුතු හඳු සොයා බලා දැන ගැනීම සහ ඒ තුළින් හා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා මෙය යෝජනා ලෙස ඉදිරිපත් කරමි

මෙයට

LHK දයාතිලක

එල්.එච්.කේ. දයාතිලක
පොදුජන පෙරමුණ
ප්‍රාදේශීය සභා මන්ත්‍රී
උහන ප්‍රාදේශීය සභාව

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ජී. ජයතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මහතා.**

පසුගිය කාලයේ ආදායම් උත්පාදන යෝජනා ඉදිරිපත් කිරීමේදී රජගල පුරාවිද්‍යා භූමියේ සංචාරකින් සදහා පහසුකම් සැලසීම තුලින් සභාවට විශාල ආදායම් මාර්ගයක් ලබාගත හැකි බව පෙන්වා දුන් බව ප්‍රකාශ කරන ලදි.දැන් ලැබෙන ආරංචි මාර්ග අනුව මේ ස්ථානයේ කැනීම් කටයුතු කලේ විශ්ව විද්‍යාල මගින් බවත් ,එම අවස්ථාවේ දඹර අමිල හිමියන් මෙම ස්ථානයේ පන්සලක් හදා අපි අනුගමනය කරන්නට හැදූ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නට හැදූ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නට හදන බව අපට දැනගන්නට ලැබුනු බව ප්‍රකාශ කරන ලදි.එම නිසා මෙය දැනගත් වහාම ප්‍රදේශයේ ජනතාව ,මහා සංඝරත්නය රජගලතැන්න විහාරයට රැස්වී මේ පිළිබදව සාකච්ඡාන් කල බවත් ,රජගල සුරැකීමේ කමිටුවක් ලෙස ඉදිරිකටයුතු කිරීමට යෝජනා කරගත් බවත්, කොළඹින් පැමිණ මේ ආකාරයට වැඩපිළිවෙල කලොත් රැකියා අවස්ථා විශාල වශයෙන් බිහිවූවත් ඒවාට කොළඹ අය යොදා ගනීවියැයි භීතියක් පවතින බවත් පැහැදිලි කරන ලදි.නමුත් ගමට මත් ද්‍රව්‍ය උවදුර වැඩිවිය හැකි බවත් ,ඒ තුළින් ගමේ තරුණ තරුණියන්ට විනාශකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවිය හැකි බැවින් මේ සදහා විශාල විරෝධතාවයක් පවතින බවත් , එසේම මේ පිළිබද මහජනතාව හා මහා සංඝරත්නය තවදුරටත් දැනුවත් කර මෙයට විරෝධය දැක්වීමට බලාපොරොත්තු වන බව පෙන්වා දෙන ලදි. මීට පෙරද රජගල චෛත්‍යයක් හදා ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමේදී දඹර අමිල හිමියන් මූලිකත්වය ගෙන කටයුතු කල බවත් , මේ අවස්ථාවේ එම ස්වාමීන් වහන්සේ අම්පාර ප්‍රදේශයේ කිසිම පන්සලක ස්වාමීන් වහන්සේ නමක්වත් දැනුවත් නොකර කෙලින්ම කොළඹ සිට ධාතූන් වහන්සේලා වැඩම වීමට කටයුතු සූදානම් කර තිබූ බවත් ,මෙය දැනගත් වහාම දිසාපතිතුමා , ප්‍රාදේශිය ලේකම්තුමා , පොලිසිය ,මහා සංඝරත්නය රජගලතැන්න විහාරයට එක් රැස් කර විරෝධතාවය දැක්වූ බවත් ,ධාතූ තැන්පත් කිරීම නවතා රජගලතැන්න විහාරස්ථානයේ තැන්පත්කර ක්‍රමවත් ආකාරයට රැගෙන ගොස් චෛත්‍යයේ තැන්පත් කිරීමට කටයුතු කල බව පැහැදිලි කරන ලදි.රජගලතැන්න විහාරස්ථානයේ වැඩසිටි අපවත් වී වදාල උහන පියදස්සී ස්වාමීන් වහන්සේ මෙය ආරක්ෂා කර ගැනීමට බොහෝ කැපවුනු බවත් ප්‍රකාශ කරන ලදි.පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් අක්කර දෙකක භූමි ප්‍රමාණයක් වෙන්කර දී ඇති බවත් ,අපට ලියවිල්ලක් ලෙස ලබා දී නොමැති නිසා මේ කටයුතු ආරම්භ නොකල බවත් , ශ්‍රමදානයක් යොදා එම අක්කර දෙකක භූමිප්‍රදේශය එලි පෙහෙලි කර ශුද්ධකර ඇති බව ප්‍රකාශ කරන ලදි. මේ කරුණු දැනගැනීම සදහා මා සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කල බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි.**

පෙරේදා දිනයේ විහාරස්ථානයේ මේ සම්බන්ධව සාකච්ඡාවක් තිබූ බවත්, මීට පෙරත් දයාතිලක මන්ත්‍රීතුමා සදහන් කල ආකාරයටම දඹර අමිල හාමුදුරුවෝ මේකට සම්බන්ධ වූ බවත් , මා දන්නා ආකාරයට සන්ධාන ආණ්ඩුව තිබුන කාලයේ විජිත හේරත් මහතා සම්බන්ධ වී ජාතික භික්ෂු පෙරමුනේ දඹර අමිල හාමුදුරුවෝ සභාපති ලෙස ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වී සිටි බවත් ,ඒ කාලයේ කැනීම් කටයුතු ආරම්භ කල බවත් ,අපට ලොකු අසාධාරණයක් වී ඇති බවත් , පුරා විද්‍යා කැනීම් කටයුතු වල එකසිය ගණනක් රාජකාරි කරන බවත් ,නුගේලන්ද ගම ගත් විට එම එකසිය ගණනටම ඉන්නේ එක් අයෙකු පමණක් බවත් , දේශපාලන හේතූන් මත බදවාගත් අය ඒ සදහා යොදාගෙන ඇති බවත් , දයාතිලක මන්ත්‍රීතුමා පැවසූ පරිදිම ඒ හාමුදුරුවෝ අසාදාරණයක් කල බව පැහැදිලි කරන ලදි.මේ රජගල භූමිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සොයාගැනීමක් ලෙස නම් කිරීමට දඹර අමිල හිමි සූදානම් වන බවත් , නමුත් මෙය සොයාගත්තේ ඒ කාලයේ නොවන බවත් , විශේෂයෙන් රැක බලා ගත්තේ , කැපකිරීම් කලේ ,අම්පාර ,මඩකලපුව දෙදිසාවේ ප්‍රධාන සංඝනායක උහන පියදස්සී නායක හාමුදුරුවන් බවත් ,සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කිහිප දෙනෙක් සමග උන් වහන්සේ මෙය ආරක්ෂා කල බවත් පැහැදිලි කරන ලදි.ඉන්පසු උන්වහන්සේ වැඩසිටි රජගලතැන්න පන්සල අක්කර කාලක් වැනි පුංචි ඉඩක තිබෙන බැවින් භාවනා යෝගීව කටයුතු කරන්නට උන්වහන්සේට එය ඉඩකඩ මදි බැවින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර පංසලක් සෑදීමට ඉඩමක් වෙන්කර ගත්බව ප්‍රකාශ කරන ලදි.අනුබුදු මිහිඳු හිමියන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කර ඇති බව සදහන් එකම සෙල් ලිපිය මෙම රජගල භූමියේ ඇති බවත් ,එසේම මිහිඳු හිමියන් ලංකාවට වැඩියා කියා සෙල්ලිපියක් තිබේ නම් එය තිබෙන්නේ රජගල

කන්දේ පමණක් බව ප්‍රකාශ කරන ලදි.මේ දේවල් ආරක්ෂා කිරීමට නායක හාමුදුරුවන් වහන්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසරය ඉල්ලා සිටි බවත් , එසේ වූවාට පසු අක්කර දෙකහමාරක නීත්‍යානුකූලව අවසර පත්‍රයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති බවත් ,එයට තව වනජීවී දෙපාර්තමේන්තුවෙන් අවසරය ගතයුතු බවත් , තවම වනජීවී දෙපාර්තමේන්තුවෙන් අවසරය ලබා දී නැති බවත් ,ප්‍රකාශ කරන ලදි.නායක හාමුදුරුවන් වැඩසිටින කාලයේ එක් කාමරයක් සදා වැසිකිලි කැසිකිලි පහසුකම් හැදූ බවත් ,එම ස්ථානය රජගල කන්ද කාලයේම පන්සලක් ලෙස පාවිච්චි කරපු තැනක් බව ප්‍රකාශ කරන ලදි.පරණ චෛත්‍ය තිබූ ස්ථාන ,පරණ සංඝාවාස තිබුනු ස්ථාන පරණ බෝධීන් වහන්සේලා තිබුණු ස්ථාන එම ස්ථානයේ තිබෙන බව ප්‍රකාශ කරන ලදි.එවැනි වාතාවරණයක දඹර අමිල හාමුදුරුවෝ චෛත්‍යයක් සාදා ධාතූන් වහන්සේලා තැන්පත් කරන අවස්ථාවේඅපේ හාමුදුරුවරු කවුරුවත් දැනුවත් නොකර කොළඹින් භික්ෂූන් වහන්සේලා වැඩමවාගෙන කටයුතු සිදුකරන්නට යෙදුනේ එයාලා සොයාගත් ස්ථානයක් ලෙස සලකාගෙන බව ප්‍රකාශ කරන ලදි.ඒ හාමුදුරුවෝ වැඩමවන්නට පෙර අපි ඔය ස්ථානය දැක බලා ගන්නට ගොස් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.දහම් පාසල් දරුවන් රැගෙන අපි ඔය ස්ථානයට ගොස් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිව සිටින කාලයේ කන්ද උඩ පදිංචියක් හදාගන්නට උත්සාහයක් ගත් බවත් , ඒ කන්ද උඩ තිබෙන්නේ මහ රහතන් වහන්සේලා වැඩසිටි කුටි පමණක් බවත් , පැහැදිලි කරන ලදි.ඕවා රැක බලා ගන්නට මහා සංඝරත්නය විශාල කැපකිරීම් කල බවත් , නායක හාමුදුරුවෝ විශාල කැපකිරීම් කල බවත් , එසේ කැපකිරීම් කල අය සිටියදී වෙනම පාර්ශවයක් මේ තුලින් ලාභ ප්‍රයෝජන ලබාගන්න උත්සාහ කරන බව පැහැදිලි කරන ලදි.මේ රජගල කන්ද යනු මුදල් ආකරයක් බවත් , මේ තුළින් මිළ මුදල් හොදට හොයන්නට පුළුවන් වන විට මිහිදු හාමුදුරුවන්ගේ පැමිණීම පිළිබඳ තිබෙන එකම සෙල් ලිපිය මෙහි තිබෙන විට ඒක ඉලක්ක කර ගෙන මේ හාමුදුරුවන් කටයුතු කරන බව පෙනී යන බවත් ,දිසාපතිතුමා දැනුවත් කලත් එතුමා පවසා සිටින්නේ එහෙම දෙයක් නොමැති බවයි.ඒ අය පැමිණිපසු ඉන්නට පහසුකම් හදනවායැයි පැවසූ බවත් , එහෙම පහසුකම් හදනවානම් රාජ්‍ය නිළධාරීන් මැදිහත් වී පහසුකම් හැදුවාට ප්‍රශ්නයක් නැති බවත් , පෙන්වා දෙන ලදි.අවට භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කරගෙන පහසුකම් හැදුවාට ප්‍රශ්නයක් නැති බව ප්‍රකාශ කරන ලදි.නමුත් අපට අක්කර දෙකහමාරක් පල්ලෙහායින් ලබා දී ඔවුන් කන්ද උඩ ඉදිකිරීම් කිරීමට සැරසෙන්නේ මිළ මුදල් පැත්ත ඉස්සර කරගෙන බව ප්‍රකාශ කරන ලදි.එමනිසා අප විසින් අයවැය යෝජනා වලදී සභාවට ආදායමක් ලබා ගැනීමට රජගල කන්ද ගැන යෝජනා කර ඇති බව පෙන්වා දෙන ලදි.මේ මස 22 දින විදුර වික්‍රමනායක ඇමතිතුමා රජගල කන්දට පැමිණෙන බව ආරංචි බවත් , අවට විහාරස්ථාන වල කිසිම කෙනෙක් මේ පිළිබඳ නොදන්නා බව පැහැදිලි කරන ලදි.ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වත් මේ පිළිබඳ දැනුවත් නැති බව ප්‍රකාශ කරන ලදි.මේ දේවල් සමග මේ ගැටළුව ඇති වී ඇති බවත් , මෙය අපට උරුම දෙයක් බවත්, දිගාමඩුල්ලට උරුම දෙයක් බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය කාලයේ කම්කරුවන් ගන්නා විට රජගලතැන්න, නුගේලන්ද ගම් වලට ප්‍රමුඛස්ථානයක් වත් ලබා නොදුන් බවත් ,යුද්ධ කාලයේ මේවා රැක බලා ගත්තේ ඔවුන් බවත් පැහැදිලි කරන ලදි.අප සභාව ලෙස දේශපාලන අධිකාරියේ අපට සම්බන්ද ඉහල අය දැනුවත් කර මේ කටයුත්ත නතර වෙන තැනට වැඩකටයුතු කලයුතු බව ප්‍රකාශ කරන ලදි.සංවර්ධනය වනවාට අපි කැමති බවත් ,විශ්‍රාම ශාලා ඉදිකරාට ප්‍රශ්නයක් නැති බවත් ,නමුත් ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලා මගින් එය සිදු විය යුතු බව ප්‍රකාශ කරන ලදි. අපි එක ගමකින් දෙතුන්දෙනා ගණනේ සහභාගී කරගෙන විශාල සමිතියක් පිහිටවූ බවත් ,ජයවීර මන්ත්‍රීතුමාත් ,දයාතිලක මන්ත්‍රීතුමාත් එහි කාරක සභාවේ ප්‍රධානියෝ ලෙස කටයුතු කරන බවත් පැහැදිලි කරන ලදි.සෙනසුරාදා සවස 3.00 ට සාසනාරක්ෂකබළ මණ්ඩලයේ හාමුදුරුවරු සමග විශේෂ සාකච්ඡාවක් පවත්වන බවත් , එයට සම්බන්ධ විය හැකි අය සම්බන්ධ වන ලෙසද , අපට මේ රජගල භූමිය රැක බලා ගැනීමට කටයුතු සලසා දෙන ලෙස මේ සභාවෙන් ඉල්ලා සිටින බවත් , එයට සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ජයතිලක මහතා.**

වැඩ බලන සභාපතිතුමනි,මේ යෝජනාව දයාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර , මා විසින් ස්ථිර කළ බවත් , ස්වාමීන් වහන්සේ රජගල කන්ද පිලිබද පෞරාණික වටිනාකමත් සමග දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කල බවත් , මෙය දිගාමඩුල්ලට ඉතාමත්ම වටිනා ඓතිහාසික ස්ථානයක් බවත් , එය අපට ලැබුනු දායාදයක් බවත් , එය රැක ගැනීම සියළු දෙනාගෙම වගකීම බව පෙන්වා දෙන ලදි.මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ලෙස අප සියළුදෙනාගෙම වගකීම මේ දේවල් ආරක්ෂා කිරීම විය යුතු බවත් ,විශේෂයෙන්ම කොළඹ

ප්‍රදේශයේ සිට පැමිණ එවැනි කටයුත්තක් උන්වහන්සේ සිදු කරනවානම් , අම්පාරේ දිසාපතිතුමා හෝ ප්‍රාදේශිය ලේකම් තුමා වත් මේ පිළිබඳව නොදන්නවා නම් , කවුරුන් හෝ විශේෂ අනුග්‍රහයක් , අනුබල දීමක් සිදුවනවා ඇති යැයි ප්‍රකාශ කරන ලදි.කිසිම ප්‍රශ්නයක් නැතිව මේ කටයුතු මෙසේ වන්නේ ඒ නිසා වන්නට පුළුවන් බව ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් සිටින බවත්,දඹර අමිල හිමි පවසනවානම් මේ රජගල කන්ද සොයාගත්තේ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කියා ඒක අමූලික බොරුවක් බවත් අපි පුංචි කාලයේ පවා රජගල කන්ද බලන්නට ගොස් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.ඒ කාලයේත් යම් යම් ස්ථාන සොයාගෙන තිබුනු බව පැහැදිලි කරන ලදි. මේ වනවිට මේ කන්ද පාලනය කරන්නේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කණ්ඩායමක් බවත් ,පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන එතන කටයුතු කරන බව පෙන්වා දෙන ලදි.මේ කාරණයේදී මහජන නියෝජිතයන් ලෙස මැදිහත්විය යුතු බව ප්‍රකාශ කරන ලදි.අපෙන් ලබාදිය හැකි උපරිම සහයෝගය ලබාදිය යුතු බව ප්‍රකාශ කරන ලදි.සභාවට පැමිණි මුල් කාලයේ සිටම දයාතිලක මන්ත්‍රීතුමා මේ ස්ථානය පිළිබද මේ සභාවේ වරින්වර යෝජනා ගෙන ආ බවත් , අපි ඒවා අනුමත කර සම්මත කල බවත් ,නමුත් ඒවා ක්‍රියාත්මක නොවූ බවත් ,මෑතකදී ද මාස දෙකකට පමණ උඩදී  ද ඒ සම්බන්ධව කතාකල බවත් , සභාපතිතුමා ඒ පිළිබඳව කටයුතු කරන බව පවසා සිටිය බවත් , නමුත් තාමත් ඒවා ක්‍රියාත්මක වී නැති බව ප්‍රකාශ කරන ලදි.සභාවක් ලෙස අප මැදිහත් වී කටයුතු කිරීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.සභාව මගින් සංචාරක ස්ථානයක් ස්ථාපිත කර සභාවට ආදායම් ගෙනෙන මාර්ගයක් සකස්කල හැකි බව පෙන්වා දෙන ලදි.අපි වසර පහක් තුළ සම්මත කරපු කිසිම යෝජනාවක් ක්‍රියාත්මක නොකිරීම කනගාටුවට කරුණක් බවත්, හැම අවස්ථාවකම හොද දෙයක් අප විසින් යෝජනා කර ස්ථිර කරන නමුත්,ඒවා ක්‍රියාත්මක නොවන බවද ප්‍රකාශ කරන ලදි.හැම අවස්ථාවකම අපි දකින්නේ මේ සභාවේ තිබෙන මුදල් ටික කවුරු කවුරු හෝ බෙදාගෙන කළමනාකරණය කර ගන්නවා මිසක් , සභාවට ආදායම් මාර්ගයක් හෝ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් වැඩක් කරනවා කියන එක මම නොදන්නා බවත් ,ප්‍රකාශ කරන ලදි.පසුගිය කාලයේ කොරෝනා වසංගතය පැමිණි අවස්ථාවේ සමහර ගෙවල් වලට බෙහෙත් ටිකක් හෝ ගසා ගැනීමට නොහැකි වූ බවත් ,එවැනි තත්වයන් අවුරුදු පහක කාලසීමාවේ අපට දකින්නට ලැබුනු බව ප්‍රකාශ කරන ලදි.රජගල ස්ථානය ආරක්ෂා කිරීම සඳහා ඕනෑම වැඩපිළිවෙලක් යොදනවානම් සියළු දෙනාගේම සහයෝගය ලබා දී උදව් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

වැඩබලන සභාපතිතුමනි,හදිසි යෝජනාවක් සභාවට ගෙන ආ බවත්, ඒ යෝජනාව ස්ථිර කර ඇති බවත් , රාජ්‍ය ආයතනයක් ලෙස හා ජනතා නියෝජිතයන් ලෙස මේ ප්‍රශ්නය බේරා ගැනීම සඳහා මේ ප්‍රදේශයේ සිටින මහා සංඝරත්නය ප්‍රථම කොටම ඉදිරියට පැමිණිය යුතුයි යන චේතනාවෙන් මා සිටින බවත් ,රජගල පෞරාණික වටිනා කමක් තිබෙන අපේ බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස සලකන බවත් ,මෙය පන්සලක් ලෙස ලියාපදිංචි වී තිබෙනවාද ,පුරාවිද්‍යා ස්ථානයක් ලෙස තිබෙනවාද යන්න මම නිවැරදිව නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.මෙම ස්ථානයේ අයිතිකරුවකු නැති බවත්, දීඝවාපිය හා බුද්ධංගල ආදී පුරාවිද්‍යා ස්ථන ගත්විට එහි අයිතිකාරත්වයක් තිබෙන බවත් නමුත් මේ රජගල කියන වටිනාකමක් තිබෙන ස්ථානයේ නායකයෙක් නොමැති බවත් , නායකයෙක් නැති තැන නායකයෙක් වෙන්න දඟලන වෙරක් ලෙස මට හැගෙන බවත් ,මේක හොද සම්පතක් බවත් පැහැදිලි කරන ලදි. මෙතනට දේශපාලන අත පෙවීමක් සිදුවෙමින් පවතින බව හැගෙන බවත් අප එතනට විරෝධය පෑම සිදුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.උහන පියදස්සී හාමුදුරුවෝ මෙය රැක බලා ගැනීමට යම්කිසි කැපකිරීමක් කර තිබෙනවානම් ඒ ස්වාමීන් වහන්සේගේ පරම්පරාවේ යම් ආගමික කොට්ඨාශයකට හෝ යම් භික්ෂුවකට එහි නායකත්වය ලබා දිය යුතු බව මාගේ මතය බවත් පැහැදිති කරන ලදි. සංචාරකයින්ට පහසුකම් දෙන්න ආදී ලෙස මේ සභාවේ යෝජනා සිදුවන බවත් ,නමුත් ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමට අරමුදල් අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදි.ඒවාට ක්‍රමවේදයක් අවශ්‍ය බවත් පැහැදිලි කරන ලදි.සභාබල ප්‍රදේශයේ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් කරනවානම් විධිමත් ආකාරයෙන් අවසර නොගෙන කරන්නේ නම් එයට විරුද්ධව කටයුතු කිරීමට හැකියාව සභාව සතුව තිබෙන බවත් පැහැදිලි කරන ලදි.එම ස්ථානයේ දැනටත් පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික පුද්ගලයන් සිටින බවත් ,වෙන්කර දුන් ඉඩමේ රජය මැදිහත් වී යම් පහසුකම් ටිකක් සැපයීම සිදුකරන්නට හදනවානම් එය නිවැරදි බවත් ,නමුත් පෞද්ගලිකව කවුරුන් හෝ එය කරනවා නම් එයට අවසර ගතයුතු ක්‍රමවේදයක් ඇති බවත් , අපේ පාර්ලිමේන්තු මැති ඇමති වරු දැනුවත් කිරීම ,පලාත්

සභාව දැනුවත් කිරීම ,සිදුවියයුතු බව පෙන්වා දෙන ලදි.අපට පුළුවන්නම් එල්ලාවල මේධානන්ද හිමිට ලිපියක් යොමුකර මෙහි සැබෑතත්වය හා මේ පිළිබඳ උපදෙස් ඉල්ලා සිටීම සුදුසු බවත් ,එවිට අපට පැහැදිලි උපදෙස් ටිකක් ලැබේවි යැයි විස්වාස කරන බව ප්‍රකාශ කරන ලදි.නමුත් අධ්‍යාපනික කටයුත්තක් සිදුවනවා නම් ප්‍රශ්නයක් නැති බවත් , දඹර අමිල හිමි පුරාවිද්‍යා පිළිබඳ කතිකාචාර්ය වරයෙක් බැවින් අධ්‍යාපනික කටයුතු වලට පැමිණීමේදී පහසුකම් නොමැති නිසා මෙසේ පහසුකම් හදන්නට යනවාද යන්න බැලිය යුතු බවත් , ප්‍රකාශ කරන ලදි.මෙය රජය මැදිහත් වී විසදිය යුතු ප්‍රශ්නයක් බවත් සභාවෙන් අපට මෙයට තහන්චි දැමිය නොහැකි බවත් පෙන්වා දෙන ලදි.සභාවෙන් දැමිය හැකි එකම තහන්චිය වන්නේ අවසරයක් නැතිව ගොඩනැගිලි ඉදිකිරීම තහනම් කල හැකි බවත් ,වෙන අපට කල හැක්කක් නොමැති බව පැහැදිලි කරන ලදි.

**ගරුඋපසභාපතිතුමා.(මූලාසනය )**

අයවැය වාර්තාවට ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස මෙය යෝජනාවක් ලෙස පැමිණි බවත් , පන්සලට වෙන් කෙරුණු ඉඩමට අපට සම්බන්ධ විය නොහැකි බවත් ,ඔය කියන ආකාරයට පිටින් ඇවිත් පන්සල හදන්නට නොහැකි බවත් , ප්‍රදේශයේ මහ ජනතාවගේ විරෝධය හා ප්‍රදේශයේ මැති ඇමති වරුන්ගේ මැදිහත් වීම නිසා පිටින් ඇවිත් පන්සල හදා පිට හාමුදුරු කෙනෙකුට පදිංචි වීමට නොහැකි බවත් ,සභාවේ ගෙන ආ යෝජනාව ක්‍රියාත්මක කිරීමට නම් පළමුවෙන්ම සභාවට ඉඩමක් වෙන් කර ගැනීම සිදුවියයුතු බවත් ,සභාවට ඉඩමක් වෙන් කර ගැනීමේ ක්‍රමවේදයට දිසාපති තුමා හෝ ප්‍රාදේශිය ලේකම් තුමා ඉඩමක් වෙන්කර දෙන්නේ නැත්නම් පුරාවිද්‍යා භූමි ප්‍රදේශයෙන් එහා පුද්ගලික මිනිසුන් පරිහරණය කරන ඉඩම් තිබෙන බැවින් එවැනි ඉඩමක් මිළදී ගෙන වත්කම් අත්පත් කර ගැනීමට හැකි බව පෙන්වා දෙන ලදි.අපට අවශ්‍ය වන්නේ මේ පුරාවිද්‍යා ස්ථානය රැකබලා ගැනීම හා ඒ තුළින් සභාවට යම් ආදායම් මාර්ගයක් ලබා ගැනීම බව ප්‍රකාශ කරන ලදි.එයට ක්‍රමවේදයක් අප විසින් සකස් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.මේ යෝජනාවේ සම්බන්ධ කාරණා පිළිබඳ දිසාපතිතුමා හා ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කලයුතු බවද පෙන්වා දෙන ලදි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් දැනුවත් කලයුතු බවද පැහැදිලි කරන ලදි.සභාවක් ලෙස මෙයට මැදිහත්විය ක්‍රමවේදයක් සොයාබැලිය යුතු බවත් සභාව සඳහා ඉඩමක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදය සිදුකලයුතු බවත් පැහැදිලි කරන ලදි.පුද්ගලික කෙනෙකුට ඉඩමක් නැහැ කියුවිට ඉඩමක් ලබා දෙනවා නම් , සභාවට ආදායමක් උත්පාදනය සඳහා ඉඩමක් ඉල්ලූ විට නොදී ඉන්න එකක් නැති බවත් එමනිසා මුලින්ම ඉඩමක් ගැනීම සඳහා අවශ්‍යය ලියකියවිලි සකස් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මයා.**

දයාතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ප්‍රදේශයේ සම්පතක් රැකගැනීමට ගත් උත්සාහයක් බවත්, ඒ පිළිබඳව එතුමාට ස්තුති වන්ත වන බව ප්‍රකාශ කරන ලදි. ඉතාම වටිනා සම්පත් දෙකක් තිබෙන බවත් , බුද්ධංගල , රජගල යනු අපට දැනුනේ නැති වුනාට ලංකාවේ බෞද්ධයන්ට ඉතාම හොදින් දැනෙන මේ ප්‍රදේශයේ ඉතාම වටිනා සිද්ධස්ථාන දෙකක් බවත් , එම ස්ථාන වලට පිට පලාත් වල ජනතාව දහස් ගණනින් පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදි. මේ ස්ථාන සඳහා දේශපාලන නායකයින්ගේ මැදිහත් වීම මීට වඩා එහා ගොස් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය කාලයේ අම්පාර නගර සභාව මහනගර සභාවක් බවට පත්කිරීමට යාමේදී උහනට අයිති බුද්ධංගල ප්‍රදේශය අම්පාරට යන්න ඕන කියා අපේ මන්ත්‍රීවරියක්ම යෝජනා කර තිබූ බවත් , අපේ හදවත බඳු සිද්ධස්ථානයක් අම්පාරට ලියා දීමට අපිම කටයුතු කල අවස්ථා තිබූ බවත් පෙන්වා දෙන ලදි. වැඩිදුර හිතන්නේ නැතිව කරන කටයුතු වලින් ප්‍රදේශයේ තිබෙන වටිනාකම අප විසින්ම හැල්ලු කරන බවත් අප විසින්ම නැතිකර ගන්නා බව ප්‍රකාශ කරන ලදි. අපේ ස්වාමීන් වහන්සේ පැහැදිලි කරන විට බෞද්ධ නායකත්වය අපේ ගරුතර සංඝරත්නය දැනුවත් නොකොට මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා පැමිණි දඹර අමිල ස්වාමීන් වහන්සේ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පිළිබඳ කතිකාචාර්ය වරයෙක් බවත් එම ස්වාමීන් වහන්සේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් සමග මේ පුරාවිද්‍යා ස්ථානය ගවේෂණයට පැමිණි බවත් , ඒ ගවේෂණ කටයුතු වලට පැමින මේ ස්ථානයට අයිතිවාසිකම් කියන්නට පැමිණෙනවානම් එය සුදුසු දෙයක් නොවන බවත්, මේ ප්‍රදේශයට උරුම වුනු , ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේලා දිවි හිමියෙන් රැකගත්ත , ප්‍රදේශයේ ජනතාව මේවා ආරක්ෂාකල නිසා අද ලෝකවාසී ජනතාවට රජගල විහාරස්ථානය නටඹුන් හෝ

බැලීමට ඉතිරි වී ඇති බවත් ,පැහැදිලි කරන ලදි. හිටපු සභාපතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය සභාවක් ලෙස කරන්නට පුළුවන් කටයුතු අල්ප බවයි.ඉදිකිරීමක් කරන විට අප එයට අවසර දීම සිදුවිය යුතු බව පවසා සිටි බවත් , ජනතා නියෝජිතයන් ලෙස අප මේ ප්‍රදේශය පිළිබද තීන්දු තීරණ ගැනීමට අපතුළ විශේෂ වගකීමක් තිබෙන බවත් ,ප්‍රදේශයේ යම් අකටයුත්තක් වනවා නම් එයට පෙනී සිට එයට අදහස් දක්වා අපේ ගරුතර ස්වාමීන්වහන්සේලා සමග එකතු වී ජනතාවත් සමග එකතු වී එයට දෙන්න පුළුවන් නායකත්වය ලබා දී ප්‍රදේශයට හයියක් වී මේ බෞද්ධ උරුමය අපේ ස්වාමීන් වහන්සේලාගෙන් ගිලිහී යාමට නොදී වලක්වා ගැනීම අපේ යුතුකම බවත් පෙන්වා දෙන ලදි. සභාවටඉදිරිපත් කරපු මේ කාරණය එක යෝජනාවක් ලෙස සාකච්ඡාකර බැහැර කරනවාට වඩා මේ පිළිබදව ක්‍රියාත්මක විය යුතු බවත් ,අපි සභාවේ ගත් තීන්දු තීරණ ඉතා ඉක්මනින් අවශ්‍යය ස්ථන වලට යොමුකර ඒවාට අවශ්‍යය පිළිතුරු ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රදේශය පිළිබද තීන්දු තීරණ ගැනීමට දිස්ත්‍රික් සංවර්ධන කමිටුව තිබෙන බවත් , එයට ගරු ඇමතිවරු, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති තුමා ඇතුළු, මේ ප්‍රදේශයේ දිසාපතිතුමා , ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු රාජ්‍ය ආයතන වල නායකයින් සියළුමදෙනා සහභාගී වන බවත් , එයට මේ සම්බන්ධව ලිපියක් යොමු කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදි.එසේම දිසාපතිතුමාට සභාවක් ලෙස ලිඛිතව යොමුකර දැනුවත් කිරීම සිදුවිය යුතු බවත් පෙන්වා දෙන ලදි. අපේ ස්වාමීන් වහන්සේගෙන් හා දයාතිලක මන්ත්‍රීතුමා , ජයවීර මන්ත්‍රීතුමා , ඔබතුමාලාගෙන් ඉල්ලීමක් ලෙස කරන්නේ මේ සම්බන්ධව සාකච්ඡා කරන අවස්ථාවල ඔබතුමාලා සූදානම් කරගත් කමිටු හරහා මේ පිළිබද ඉල්ලීමක් සූදානම් කරගෙන ප්‍රාදේශීය සභාව හරහා හෝ අපේ ජනතා නියෝජිතයන් හරහා නිළධාරීන් දැනුවත් කිරීම සඳහා නීත්‍යානුකූල ලියවිලි ලෙස සකස්කර ගැනීම සුදුසු බව මාගේ අදහස බවත් ප්‍රකාශ කරන ලදි. බොහෝ ආගමික සිද්ධස්ථනවල මුදල් හම්බකිරීම සිදුවන බවත්, මෙයත් එවැනි දෙයක මූලාරම්භයක් වියහැකි බවත් , පෙන්වා දෙන ලදි.එමනිසා මේවා හානි නොවන ආකාරයට ප්‍රදේශයේ ජනතාවට අත්වෙන්නට තිබෙන දෙයක් උදුරා ගන්නේ නැතිව කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි. ප්‍රාදේශීය සභාවට ගන්න තිබෙන දෙයක් අහක බලාගෙන අතහරිනවාට වඩා අපි අපට පුළුවන් ආකාරයට මේ පිළිබද මැදිහත් වීමක් කර ,ඉඩමක් ලබා ගන්නට පුළුවන්නම් එය ක්‍රියාත්මක කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.අද සාකච්ඡා කරනවා වගේම ඉතාමත්ම ඉක්මනින් මේ පිළිබද ලියකියවිලි සකස්කර දිසාපතිතුමාට ඉල්ලීමක් සිදුකිරීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රදේශයෙන් හමුවන ධාතූන් වහන්සේලා පවා මංකොල්ලා කෑමකට ලක්වන බව මාගේ අදහස බවත් , නීලගිරි මහා සෑයෙන් හමුවූ ධාතූන් වහන්සේලා එකසිය ගනනක් කොළඹ ප්‍රදේශයට ගෙනගිය බවත් පැහැදිලි කරන ලදි.සමහර ස්ථාන වලින් හමුවන ධාතූන් වහන්සේලා මොනවා වෙනවාද , කුමන ස්ථාන වලට වැඩමවනවාද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.රජගලින් ධාතූන් වහන්සේලාගේ මංජුසාවක් හමුවූ බව දන්නා බවත් , ඒ මංජුසාවට මොකද වූයේ කියා නොදන්නා බව ප්‍රකාශ කරන ලදි. එමනිසා මන්ත්‍රීවරු සියළු දෙනා මීට වඩා උනන්දුවක් දැක්වීම සිදුවිය යුතු බවත් මේ සම්බන්ධව මොනවා හෝ සාකච්ඡාවක් තිබෙනවානම් දැනුවත් කරන ලෙස ඉල්ලීමක් කරන බව ප්‍රකාශ කරන ලදි. අපෙන් සිදුවිය යුතු උපරිම සහයෝගය මේ සඳහා ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්පකුමාර මයා.**

එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස දයාතිලක මන්ත්‍රීතුමා සභාවට යෝජනාවක් ගෙන ආ එක ගැන සතුටුවන බවත් , එතුමා මිට කලිනුත් සභාවට මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කල බවත්,ජයතිලක මන්ත්‍රීතුමා , හිටපු සභාපතිතුමා, දෙලංකාවල මන්ත්‍රීතුමා, අදහස් ප්‍රකාශ කල බවත්, එතුමාගේ යෝජනාව පැහැදිලි බවත්, ප්‍රකාශ කරන ලදි.ස්වාමීන් වහන්සේත් දීර්ඝ ලෙස ඒ පිළිබදව කතා කල බවත් පෙන්වා දෙන ලදි.දයාතිලක මන්ත්‍රීතුමා මේ රජගල පිළිබද යෝජනාවක් මීට පෙරද ගෙන ආ බවත්, අපට රජගල පුරාවිද්‍යා භූමියේ ආදායම් උපයන්න ක්‍රමවේදයක් සෑදීමට පුළුවන් බවත්, එය ක්‍රියාත්මක කරන ලෙස ඒ යෝජනාවේ සඳහන් වූ බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් මේ වනතුරු එම යෝජනාවට ගත් කිසිම තීන්දුවක් , ප්‍රතිඵලයක් නැති බවත්, එම යෝජනාවට කිසිම තීරණයක් මේ වනතුරු නොගත් බවත්, එසේ එම යෝජනාවට අපි එදා යම් තීරණයක් අරගෙන තිබුනානම් දැන් මේ පැනනැගී ඇති ප්‍රශ්නයේදී මෙතරම් ගැටළුකාරී තත්වයක් ඇති නොවන බවත්, සභාව මේ සඳහා මැදිහත් වී යම් කටයුත්තකට සැරසෙනවා යන හැගීම මේ අයට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි. පුරාවිද්‍යා ඇමතිතුමා වන විදුර වික්‍රමනායක ඇමතිතුමාගෙන් කෙලින්ම කතාකර මේ පිළිබදව විමසා සිටිය හැකි බව පෙන්වා දෙන ලදි. එසේම දඹර අම්ල හිමි කියනවා යැයි පරිදි රජගල සොයාගත්තේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් යැයි කීම වැරදි

මතයක් බවත්, විශ්ව විද්‍යාලයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හා සමගාමීව මේ රජගල කැනීම් කටයුතු කරන බවත්, රජගල යනු පුරාවිද්‍යා භූමියක් බවත් පැහැදිලි කරන ලදි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය අරගෙන විශ්වවිද්‍යාල දරුවන් කැනීම් කටයුතු සිදුකරන බවත්, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රජගල සොයාගත්තා යැයි කියන්නේ රජගල සොයාගත් එක නොවන බවත්, රජගල ඓතිහාසික වටිනාකමක් තිබෙන්නේ මොන හේතුව සම්බන්ධවද කියන එක සොයාගැනීම බවත් පැහැදිලි කරන ලදි. මේ මේ දේවත් සොයාගත්තා යැයි ඔවුන් පවසන්නේ එය බවත් පෙන්වා දෙන ලදි. උහන පියදස්සී හාමුදුරුවන් ගැන අප ආඩම්බර විය යුතු බවත් , උන් වහන්සේ රජගල ආරක්ෂා කිරීමට යම් යම් දේ සිදුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. මේ අවස්ථාවට කලින්, මේ ප්‍රශ්ණය ඇතිවන්නට කලින් , අම්පාර දිස්ත්‍රික්කයේ මෙච්චර වටිනා කමක් තිබෙන, මෙච්චර වැදගත් කමක් තිබෙන භූමියක් ආරක්ෂා කිරීමට යෝජනාවක් ගෙන ආ පසුව වත් ,සභාපතිතුමාටවත් , පවතින ආණ්ඩුවට වත් , නිළධාරීන්ට වත්, මෙය ආරක්ෂාකර ගැනීමට අවශ්‍යතාවයක් නොතිබූ බව පෙන්වා දෙන ලදි. නමුත් මේ අවස්ථාවේදී ජනතාව රජගල පිළිඅරගනිමින් ,වැළදගනිමින්, සිටින පෞරාණික ස්ථානය ගැන ඉතා ඕනෑකමින් දඹර අමිල හිමියන් යම්කිසි වැඩසටහනකට යෑමට සැරසෙන බවත් , ඒ සම්බන්ධ රජයේ අමාත්‍යවරයා හා සියළුම දෙනා මෙයට මැදිහත් වී ඇති යැයි හැගෙන බවත්,එයට මූලික හේතුව නම් මේ ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය , රාජ්‍ය නිළධාරීන් ,දැනුවත් නොකර , පන්සල්වල අපට තිබෙන අයිතිය , අපට තිබෙන උරුමය, පන්සල් දැනුවත් නොකර මේ ක්‍රියාදාමය කුමක්ද යන්න එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයාවත් , අවට වාසය කරන ස්වාමීන්වහන්සේවත් නොදන්නා බව පිළිබද මේ සභාවට යෝජනාවක් ලෙස රැගෙන පැමිණ තිබෙන බවත් පැහැදිලි කරන ලදි. එවිට මේ සම්බන්ධව අපට ඍජුවම මේ ගැන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විමසිය හැකි බවත් , පුරාවිද්‍යා භාරව සිටින අමාත්‍යතුමාගෙන් විමසිය හැකි බවත් පැහැදිලි කරන ලදි.මේ ප්‍රශ්නය උද්ගත වීමට කලින් මේ සභාවට යෝජනාවක් ගෙන ආ බවත් , ඒ අවස්ථාවේදී එයට මේ සම්බන්ධව මැදිහත් වී තිබුනානම් අපි ගොඩක් ඉදිරියෙන් සිටින බවත් පෙන්වා දෙන ලදි.ඔය ප්‍රදේශයේ අපේ ස්වාමීන් වහන්සේ හා මන්ත්‍රීවරයා නොසිටියානම් එම ස්ථානයේ හෝටලයත් හදා, පන්සලකුත් හදා , වන්දනාමාන කරනකම් සභාව කිසිම දෙයක් නොදන්නා බව ප්‍රකාශ කරන ලදි.එදා ඒ දමපු යෝජනාවට සභාවක් ලෙස ක්‍රියාත්මක වූ ආකාරය විමසන ලදි. දැන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් පුරාවිද්‍යා එකේ අයිතිය අරගෙන තිබෙන බවත් ,සීගිරිය , යාපහුව , ඔවුන් යටතේ ආදායම් හොයන බවත් ,සීගිරියේ දිනකට ආදායම් ලක්ෂ 26 ක් වගේ වන බවත් ,මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් අමාත්‍යංශය යටතේ ඒවා කරගෙන යන බවත් , ඒ ආකාරයට මේ රජගලින් සංරක්ෂණය කර ප්‍රතිසංස්කරණය කර ආණ්ඩුවට ආදායම් ගෙන ඒමට ක්‍රමවේදයක් හදනවාදැයි නොදන්නා බවත් පැහැදිලි කරන ලදි.අපේ සභාබල ප්‍රදේශයේ මෙය පිහිටා තිබෙන නිසා ඒ සභාබල ප්‍රදේශයේ සභාපතිවරයා හෝ කිසිම කෙනෙක් නොදැනුවත්ව සිදු වීම අපට කණගාටුවට කරුණක් බව ප්‍රකාශ කරන ලදි.එම නිසා මේ ගැන දැන්වත් පුළුවන් තරම් හැකි ඉක්මනින් සභාව මැදිහත් වී කටයුතු කලයුතු බව ප්‍රකාශ කරන ලදි.රජගල කැනීම් කටයුතු සිදු කරන්නේ විශ්වවිද්‍යාල ළමයින් බවත් , මේ කටයුත්තට මැදිහත් වී ප්‍රදේශයේ තරුණ තරුණියන් ඒ සඳහා යෙදවීම සිදුකල යුතු බවත් පෙන්වා දෙන ලදි.මෙය පුරාවිද්‍යා වටිනාකමක් තිබෙන පුරාවිද්‍යාවට අයිති බිම් කඩක් බවත් දඹර අමිල හිමි ඇතුළු කණ්ඩායම ගවේෂණ කටයුතු කරන බවත් පැහැදිලි කරන ලදි.මේ මොහොතේ සිට හෝ මේ වෙනුවෙන් මැදිහත් වී යම් කැපකිරීමක් සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

ඔබතුමා කතා කරපු කරුණු පිලිබද සතුටුවන බවත් , අපි නම් , ගම් සදහන් කරාට මේ ප්‍රදේශයේ සත්‍ය කාරණාව අප නොදන්නා බවත් , එසේ නිවැරදිව නොදැන නම්,ගම්, පාවිච්චි කිරීම එතරම් සුදුසු නොවන බවත් , මේක ගැන සොයා බැලීමක් කර ඉදිරි පියවරට යායුතු බවත් , ඇමතිතුමා එනවා කියන එක සොයා බලන්නට හා ඉහල දේශපාලන අධිකාරිය දැනුවත් කරන්නට මා පෞද්ගලිකව වගකීම ගන්නා බවත් ,අදම මම ඒ සඳහා ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදි. දිසාපතිතුමා හා ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කිරීමේ ලිපි ලේකම්තුමිය විසින් අද දිනයේම සිදුකරන්න යැයි උපදෙස් දෙන ලදි.මන්ත්‍රීවරු 31 දෙනාගෙම යෝජනාවක් ලෙස දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට මෙය ඉදිරිපත් කරන ලෙසත් , එතනදී අපිට මෙය සාකච්ඡා කොට තීරණයක් ගැනීමට හැකි බව පෙන්වා දෙන ලදි.එතන සියළුම නිළධාරීන් සිටින බැවින් තීරණයක් ගත හැකි බව පෙන්වා දෙන ලදි.

ඒ අනුව **06/2022/12(05)** අංක දරණ යෝජනාව සම්බන්ධයෙන්, ප්‍රාදේශිය ලේකම්තුමාට හා අම්පාර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාර නිළධාරීතුමාට දිසාපතිතුමාට මේ පිළිබඳ කරුණු විමසා ලිපි නිකුත්කර කටයුතු සොයා බැලීමට හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට තීරණය විය. ඒ තීරණය සඳහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.

**07.** කාරක සභාවල වාර්තා - නැත

**08.2022** නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම

## ආදායම් විග්‍රහය -2022 නොවැම්බර්

| | | | | |
|---|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | 10,295.16 | |
| | ව්‍යාපාර බදු | රු: | 10,200.00 | |
| | බයිසිකල් | රු: | | |
| | විථිරේඛා සහතික | රු: | | |
| | වරිපනම් දඩ | රු: | | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | 310,716.70 | |
| | පෝරම ගාස්තු | රු: | 380.00 | |
| | අභ්‍යන්තර බිල්කිරීම් | රු: | 614,095.00 | |
| | සේවක ණය පොළී | රු: | 5,512.50 | |
| | වැටුප් ප්‍රතිපුර්ණය | රු: | 1,667,334.53 | |
| | **එකතුව** | රු: | | **2,618,533.89** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 16,000.00 | |
| | පරිසර බලපත්‍ර | රු: | 4,000.00 | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | 2,000.00 | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපුර්ණය | රු: | 344,380.00 | |
| | **එකතුව** | රු: | | **366,380.00** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලි | රු: | | |
| | කුලියට දීම (වාහන) | රු: | | |
| | කුලියට දීම් (භූමිය) | රු: | 9,000.00 | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | | |
| | සැලසුම් ශිල්පින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපුර්ණය | රු: | 393,315.82 | |
| | **එකතුව** | රු: | | **402,315.82** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |

| | | | | |
|---|---|---|---|---|
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලී (උහන, වෑරැන්කැටගොඩ) | රු: | 81,907.18 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 105,680.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | රු: | 4,536.32 | |
| | **එකතුව** | රු: | | **192,123.50** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | 130.00 | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 134,276.28 | |
| | **එකතුව** | රු: | | **134,406.28** |
| 07.විදුලිය | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |
| | පුනරාවර්තන ආදායම් එකතුව | | | **3,713,759.49** |
| | ප්‍රාග්ධන ආධාර | | 99,000.00 | **99,000.00** |
| | **එකතුව** | | | **3,812,759.49** |
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: | 820.00 | |
| | සේවක ණය | රු: | 110,500.00 | |
| | විවිධ තැන්පත් | රු: | 4,428.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | රු: | | |
| | මුද්දර තැන්පත් | රු: | 4,375.00 | |
| | වැටුප් තැම්පත් | රු: | | |
| | අත්තිකාරම් පියවීම | රු: | 118,870.00 | |
| | මුදල් මාරු | රු: | 674,000.00 | |
| | ණය ගැති | රු: | | |
| | **එකතුව** | රු: | | **912,993.00** |
| | **මුළු එකතුව** | | | **4,725,752.49** |

# උහන ප්‍රාදේශීය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2022 නොවැම්බර් මාසය

| | | | වවුචර් අංකය |
|---|---|---|---|
| 1 | අතිකාල ගෙවීම | | |
| | 01. ආර්.කේ.ජේ.වික්‍රමසිංහ මයා (2022 ඔක්තොම්බර් මස පැය 60ක් සඳහා) | 7,497.00 | 11/10 |
| | 02. ඒ. ප්‍රියන්ත කුමාර මයා (2022 ඔක්තොම්බර් මස පැය 60 ක් සඳහා) | 6,999.60 | 11/09 |
| | 03. එච්.ඊ. සරත් කුමාර මයා (2022 ඔක්තොම්බර් මස පැය 60 ක් සඳහා) | 6,687.00 | 11/11 |
| | 04. කේ.පී. සුගත් සමරවීර මයා (2022 ඔක්තොම්බර් මස පැය60 ක් සඳහා) | 6,499.80 | 11/08 |
| | 05. ඩී.එම්. තිස්ස කුමාර මයා (2022 ඔක්තොම්බර් මස පැය 20 ක් සඳහා ) | 2,521.60 | 11/13 |
| 2 | ජල බිල්පත් පියවීම | | |
| | 01. වීරගොඩ පොළ භූමිය (2022.08.24-2022.09.24 දක්වා) | 356.50 | 11/28 |
| | 02. උහන පොදු වැසිකිලිය (2022.10.10 දක්වා) | 3,293.98 | 11/30 |
| | 03. උහන පොදු වෙළඳ පොළ මාළු ලෑල්ල (2022.10.07 දක්වා) | 5,253.20 | 11/32/1 |
| | 04. උහන ප්‍රධාන කාර්යාලය (2022.10.08 දක්වා) | 7,583.10 | 11/32 |
| | 05. නුගේලන්ද පොළ (2022.11.14 දක්වා) | 733.70 | 11/51 |
| | 06. උහන පොලිසිය අසල ජල කාරාමය (2022.10.04) | 722.20 | 11/29 |
| | 07. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.10.10 දක්වා) | 828.00 | 11/31 |
| | 08. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.10.18 -2022.11.19 දක්වා) | 733.70 | 11/45 |
| | 09. උහන ප්‍රධාන කාර්යාලය (2022.11.08 දක්වා) | 9,794.17 | 11/46 |
| | 10. උහන පොදු වෙළඳ පොළ මාළු ලෑල්ල (2022.11.07 දක්වා) | 3,671.18 | 11/47 |
| | 11. උහන පොදු වැසිකිලිය (2022.11.10 දක්වා) | 2,042.40 | 11/48 |
| | 12. උහන පොලිසිය අසල ජල කාරාමය (2022.11.03) | 722.20 | 11/49 |
| | 13. වීරගොඩ පොළ භූමිය (2022.11.23 දක්වා) | 333.50 | 11/50 |
| | 14. නුගේලන්ද පොළ (2022.10.14 දක්වා) | 816.50 | 11/27 |
| 3 | දුරකථන බිල්පත් පියවීම | | |
| | 01. 0632250357 ( 2022.10.01-2022.10.31 දක්වා) | 512.12 | 11/41 |
| | 02. 0632250355 (2022.10.01-2022.10.31 දක්වා) | 8,624.84 | 11/40 |
| | 03. 063-2030900 (2022.10.01-2022.10.31 දක්වා) | 6,851.17 | 11/42 |
| 4 | විදුලි බිල්පත් පියවීම | | |
| | 01. උහන මහජන පුස්තකාලය (2022.09.30-2022.10.31) | 1,394.88 | 11/25 |
| | 02. උහන ප්‍රධාන කාර්යාලය (2022.09.30-2022.10.31) | 29,140.50 | 11/24 |
| | 03. ගොනාගොල්ල නිල නිවස (2022.09.03-2022.10.09) | 120.00 | 11/23 |
| | 04. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.09.03-2022.10.09) | 535.00 | 11/26 |
| | 05. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.10.09-2022.11.07) | 471.80 | 11/43 |
| | 06. ගොනාගොල්ල නිල නිවස (2022.10.09-2022.11.07) | 123.08 | 11/44 |
| | 07. උහන ප්‍රධාන කාර්යාලය (2022.10.31-2022.11.29) | 26,613.34 | 11/57 |
| 5 | ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 ඔක්තොම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 27,853.07 | 11/16 |
| 6 | ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 ඔක්තොම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 17,996.63 | 11/16 |
| 7 | එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 ඔක්තොම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | | |

| | | | |
|---|---|---|---|
| 8 | ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 ඔක්තෝම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 20,297.29 | 11/16 |
| 9 | ඒ.ආර්.පී.ඩී. බංඩාර මයා (2022 ඔක්තෝම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 28,702.51 | 11/16 |
| 10 | සේවක අර්ථසාධක අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 28,747.98 | 11/16 |
| 11 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 4,312.19 | 11/16 |
| 12 | ප්‍රාදේශිය සභා සුභ සාධක සංගමය (දෛනික වැටුප් අවකරණ) | 3,361.00 | 11/16 |
| 13 | ආර්.එම් නවින් සන්දිප බංඩාර (පරිගණක පුහුණු ලාභින්ගේ 2022 ඔක්තොම්බර් දිමනා ගෙවීම) | 4,000.00 | 11/18 |
| 14 | ආර්.එම් නවින් සන්දිප බංඩාර (පරිගණක පුහුණු ලාභින්ගේ 2022 සැප්තැම්බර් දිමනා ගෙවීම) | 3,250.00 | 11/17 |
| 15 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (සුළු මුදල්) | 4,734.00 | 11/14 |
| 16 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ලියාපදිංචි හා සාමාන්‍ය තැපෑල වෙනුවෙන් මුද්දර ලබා ගැනිම) | 2,500.00 | 11/15 |
| 17 | කිර්ති සහෝදරයෝ (ආබාධිත දිනය වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහනට සහභාගි වූ UNDP ආයතනයේ නිලධාරීන්ට හා ආබාධිත පුද්ගලයින්ට සංග්‍රහ කිරීමේ වියදම්) | 1,800.00 | 11/01 |
| 18 | එච්.ඊ. සරත් කුමාර (කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කරනු ලැබූ ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා සංග්‍රහ වියදම්) | 1,800.00 | 11/0 |
| 19 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ලියාපදිංචි හා සාමාන්‍ය තැපෑල වෙනුවෙන් මුද්දර ලබා ගැනිම) | 2,500.00 | 11/0 |
| 20 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ලියාපදිංචි හා සාමාන්‍ය තැපෑල වෙනුවෙන් මුද්දර ලබා ගැනිම) | 2,500.00 | 11/3 |
| 21 | ගරු සභාපතිතුමාගේ දුරකතන දිමනාව පියවීම (2022.05.15-2022.06.14, 2022.07.15-2022.08.04, 2022.09.15-2022.10.14) | 9,000.00 | 11/0 |
| 22 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ගෙවතු වගාව සඳහා අවශ්‍ය පොහොර ලබා ගැනිමට අතින් වියදම් වූ මුදල් ප්‍රතිපූර්ණය කිරිම) | 750.00 | 11/0 |
| 23 | නන්දසේන මෝටර්ස් (කම්පැක්ටර් රථය අලුත්වැඩියා කිරිමට අවශ්‍ය උපාංග මිලදී ගැනිම) | 4,960.00 | 11/0 |
| 24 | ආසිරි මෝටර්ස් (කම්පැක්ටර් රථයේ පිටුපස ලයිට් සවි කිරිම සඳහා අවශ්‍ය උපාංග විලදී ගැනිම) | 3,000.00 | 11/0 |
| 25 | නිව් ගම්පහ ෂාමසි (ප්‍රථමාධාර පෙට්ටියට අවශ්‍ය ඖෂධ මිලදී ගැනිම) | 1,652.00 | 11/1 |
| 26 | ධාරන පොත් හල (උහන මහජන පුස්තකාලයේ E Learning මධ්‍යස්ථානයේ රවුටරය සඳහා මුදල් ගෙවීම) | 654.00 | 11/2 |
| 27 | පුබුදු එන්ටර් ප්‍රයිසස් අම්පාර (ටෝනර් මිලදී ගැනිම) | 10,950.00 | 11/2 |
| 28 | ධාරන පොත් හල (කාර්යාලයේ බිත්ති පුවරුවේ ප්‍රදර්ශනය කිරිම සඳහා ආකෘති පත්‍ර සැකසිම සඳහා) | 1,040.00 | 11/2 |
| 29 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අම්පාර (ආයතනයට අයත් PE 8373 කැබ් රථයේ 2022.08.18 සිට 2023.08.17 දක්වා කාල සීමාව සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම) | 89,626.84 | 11/ |
| 30 | සූරිය ප්‍රකාශකයෝ මහින්ද හිමි මාවත මරදාන කොළඹ 10 (උහන ගොනාගොල්ල වීරගොඩ පුස්තකාල සඳහා පොත් මිලදී ගැනිම) | 2,000.00 | 11/3 |
| 31 | ස්ටුඩියෝ සුසන්ත උහන (2023 අයවැය වාර්තාවේ පිටකවරය සැකසිම) | 4,000.00 | 11/3 |
| 32 | ලේකම් ප්‍රාදේශිය සභාව,උහන (නිල ඇඳුම් දිමනාව ගෙවීම) | 84,000.00 | 11/3 |
| 33 | ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (සුළු මුදල්) | 4,850.00 | 11/ |
| 34 | නිව් ගම්පහ ෆාමසි (වැරැන්කැටගොඩ කඩ සංකිර්ණයට ප්‍රථමාධාර පෙට්ටිය හා අවශ්‍ය ඖෂධ මිලදී ගැනිම) | 1,607.00 | 11/ |

| | | | |
|---|---|---|---|
| 36 | සුසන්ත හාඩ්වෙයාර් - (පුස්තකාලය අසල වැසිකිළියක් ඉදිකිරීම (පිරිමි) පෝච්චියක් මිලදී ගැනීම) | 3,100.00 | 11/53 |
| 37 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - (මුද්දර ගාස්තු ගෙවීම 2022 පළමුවන කාර්තුව) | 9,975.00 | 11/59 |
| 38 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - (මුද්දර ගාස්තු ගෙවීම 2022 දෙවන කාර්තුව) | 11,425.00 | 11/60 |
| 39 | ආර්.පී.කුලරත්න (නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස්) - (අංක 515 අදාල නඩුවේ නීතිඥ ගාස්තු ගෙවීම) | 15,000.00 | 11/54 |
| 40 | ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි හා සාමාන්‍ය තැපැල වෙනුවෙන් මුද්දර ලබා ගැනීම) | 2,500.00 | 11/38 |
| 41 | දිසානායක ඉලෙක්ට්‍රිකල්ස් - සභා ගර්භයේ වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම | 9,000.00 | 11/56 |
| 42 | එච්.එම්. ඩබ්. බණ්ඩාර (ආයතනයට 2022.10.17 දින සිට 2022.10.31 දින දක්වා ලබා ගත් ඉන්ධන සඳහා බිල්පත් නිරවුල් කිරීම) | 51,625.00 | 11/55 |
| 43 | පුබුදු එන්ටර් ප්‍රයිසස් අම්පාර (LDSP ව්‍යාපෘතිය යටතේ පාසැල් කසල කළමණාකරණ උපකරණ මිලදී ගැනීම) | 400,720.00 | W/11/01 |
| 44 | ලේකම් ප්‍රාදේශීය සභාව,උහන (මුදල් මාරු) | 99,000.00 | S/11/03 |
| 45 | ලේකම් ප්‍රාදේශීය සභාව,උහන (මුදල් මාරු) | 575,000.00 | S/11/04 |
| 46 | ස්ථිර වැටුප් (නොවැම්බර් මස) | 2,503,444.63 | |
| 47 | මන්ත්‍රී දීමනා (නොවැම්බර් මස) | 480,000.00 | |
| | එකතුව | 4,705,490.73 | |
| | හරස් සටහන් | 157,636.54 | |
| | මුළු එකතුව | **4,863,127.27** | |

සකස් කළේ :-

පරීක්ෂා කළේ :-

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
උහන.

පී.ඒ.අයි. ඉරෝෂණී මැණිකේ
ලේකම්
ප්‍රාදේශීය සභාව

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

වියදම් වාර්තාවේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයට 89620.00 ගෙවූ ලෙස සඳහන්කර ඇති බවත් , මෙවරත් ඉන්ෂුවරන්ස් කරන්නට පෙර සභාපතිතුමාගේ කැබ් රථයේ වැදුනු ඒවාට ගෙවීම් කරනවාදැයි විමසූ විට , ගෙවීම් කරනවා යැයි පැවසූ බවත් , නමුත් සභාවේ වාහනයේ අලාභ ගෙවීමට වැඩ පිළිවෙලක් නොමැති බවත් , මම දන්නා ආකාරයට ඒවා එම ආයතනයෙන් නොගෙවන බවත් , එසේ ගෙවීම් නොකරන සමාගම්වල අපි රක්ෂණය නොදැමිය යුතු බව ප්‍රකාශ කරන ලදි. තවද ගොනාගොල්ල පොදු වෙළඳපලෙහි විදුලි බිල 3954.00 ක් තිබෙන බවත් වැරැන්කැටගොඩ පොදු වෙළඳපලෙහි විදුලි බිල 3461.00 තිබෙන බවත් මේවා මොනවාදැයි විමසන ලදි.තවද එච්.එම්.ප්‍රදීප් සඳකැළුම් මහතා ප්‍රාදේශීය සභා උහන ආයතනයට අයත් PE – 8373 කැබ්රථයේ සභාපතිතුමන් සමග කොළඹ ගොස් නැවත පැමිණීමේදී අතින් මුදල් ගෙවා ලබාගත් ඉන්ධන සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම රු.17200.00 ලෙස සඳහන්ව ඇති බවත්, නැවත ඩී.එම්.දිලාන් තනුජ මයා ආයතනයට අයත් PE – 8373 කැබ්රථය 2022.08.28 දින කොළඹ ගොස් ඒමට ඉන්ධන ප්‍රමාණවත් නොවන බැවින් ගොනාගොල්ල උදාර ඉන්ධන පිරවුම්හලින් රැගෙන ගිය

ඉන්ධන සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම 16100.00 ක් ලෙස සඳහන් වී ඇති බවත් , කොළඹ යෑමට කැබ් රථයේ තෙල් ටැංකිය සම්පූර්ණයෙන්ම පුරවා, ඉන්පසු බූලියකටත් අරගෙන ගොස් ඒකත් මදිවී නැවත ඉන්ධන ගසා ඇති බවත් පෙන්වා දෙන ලදි. මෙහි ක්‍රමවේදය කුමක්දැයි විමසන ලදි. මම හරිද වැරදිද දන්නේ නැති බවත්, මා දකින දේ පවසන බවත් , සභාපතිතුමා කොළඹ ගිය එක ධාවන සටහන් වල සඳහන් විය යුතු බවත් ,එසේ සඳහනක් නොදැක්ක බවත් , ප්‍රකාශ කරන ලදි.

**ගරු උප සභාපතිතුමා.(මූලාසනය )**

ඔබතුමා පවසන කාරණය තිබෙන්නේ සම්මත වූ පෙර මාසයේ වියදම් වාර්තාවේ බවත්, ඒ ගැන ප්‍රශ්න කිරීම නොහැකි බවත්, පෙන්වා දෙන ලදි. අද සභාපතිතුමා නොමැති බවත් එතුමා පැමිණි දිනක මෙය විමසන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මා මෙලෙස අසන දේ වාර්තාවේ සඳහන් කල යුතු නිසා ප්‍රශ්න කරන බවත්,මම මේ ගැන කතා කරන්නට පසුගිය සභාවේ නොසිටි බව ප්‍රකාශ කරන ලදි. ඉන්ධන ලීටර් 200 ක් පමණ කොළඹ ගොස් ඒමට පරිහරණය වී ඇති බවත් කොළඹ ගොස් ඒමට එපමණ ඉන්ධන ප්‍රමාණයක් වැය නොවන බවත්, ඒ පිළිබඳව සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබන සභා වාරයේදී අවශ්‍යය බව ප්‍රකාශ කරන ලදි.

**2022 නොවැම්බර් මස ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තාව මහ සභාවේදී සම්මත විය.**

**09.2022 නොවැම්බර් මස ධාවන සටහන් ඉදිරිපත් කිරීම**

**2022 නොවැම්බර් මස ධාවන සටහන් විස්තරය LL - 7523 කෘෘ කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසුගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **61 L** | |
| 2022.11.03 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන සහකාර වෙත ගොස් ආපසු උහන අවට ආපසු ප්‍රා.ස. වෙත | 59 | | 28 |
| 2022.11.04 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස අවට වීදි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 7 |
| 2022.11.08 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු අම්පාර පුබුදු වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.11.09 | ප්‍රා.ස. සිට 28 කොළණිය වෙත ගොස් ආපසු 28 කොළණිය වෙත ගොස් නැවත ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.11.10 | ප්‍රා.ස. සිට අම්පාර පුබුදු වෙත ගොස් නැවත දෙමටමල්පැලැස්ස වෙත ආපසු ප්‍රා.ස. ආපසු සභා වාර්තා බෙදීම සඳහා වීරගොඩ වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 91 |
| 2022.11.14 | ප්‍රා.ස සිට උහන හා ඒ අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 7 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.15 | ප්‍රා.ස. සිට අම්පාර වෙත ගොස් අම්පාර හා ඒ අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 28 |
| 2022.11.28 | ප්‍රා.ස. සිට මායාදුන්න වීදි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.11.30 | ප්‍රා.ස. සිට උහන අවට වීදි ලාම්පු නඩත්තු කර නැවත අම්පාර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 14 |
| | **මේ මස ලබා ගත් ඉන්ධන** | **59 L** | | |
| | **මුළු ඉන්ධන ප්‍රමාණය** | | **61 L** | |
| | **වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති පැ.මී. ගණන (ඉන්ධන ලිටර් 01 කින් කි.මී. 07 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 280 ක් ධාවනයේ යෙදී ඇත)** | | **40 L** | **280 Km** |
| | **මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය** | | **21 L** | |

## 2022 නොවැම්බර් මස ධාවන සටහන් විස්තරය ZB-0351 කම්පැක්ටර් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසුගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **166 L** | |
| 2022.11.01 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ ආපසු උහන නගරය වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.02 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.03 | ප්‍රා.ස. සිට උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය වැරැන්කැටගොඩ ගොනාගොල් පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.04 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.11.08 | ප්‍රා.ස. සිට උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න, නුගේලන්ද පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.09 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර ළමා නිවාසය උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 218 | | 70 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.10 | ප්‍රා.ස. සිට උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.11 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.11.14 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය ළමා නිවාසය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.11.15 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.16 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය වීරගොඩ ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.17 | ප්‍රා.ස. සිට උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොල සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.18 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය අම්පාර උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.11.21 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.11.22 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.23 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.24 | ප්‍රා.ස. සිට උහන වීරගොඩ පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.25 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.28 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන නගරය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 210 | | 49 |
| 2022.11.29 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.11.30 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| | මේ මස ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | **428 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **520 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 3.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1232 ක් ධාවනයේ යෙදී ඇත) | | **352** | **1232 Km** |
| | **මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය** | | **168 L** | |

## 2022 නොවැම්බර් මස ධාවන සටහන් විස්තරය PE-8373 කැබ් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **10 L** | |
| 2022.11.01 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු උහන නගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.11.02 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත උදාගිරිගම අවට ආපසු ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවසදක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.11.03 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු ගොනාගොල්ල ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 79 | | 56 |
| 2022.11.04 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.11.05 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු මධ්‍යම කඳවුර කල්මුනේ නැවත ප්‍රා.ස. දක්වා ආපසු කහටගස්යාය නැවත ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 104 |
| 2022.11.06 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන අවට නැවත ප්‍රා.ස. ආපසු හිඟුරාණ නැවත අම්පාර සහ ඒ අවට ආපු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 88 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.09 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.11.10 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු සියඹලාවැව නැවත ප්‍රා.ස. දක්වා ආපසු නවගිරියාව නැවත ප්‍රා.ස. නැවත උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.11.11 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නුගේලන්ද නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.11.12 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.11.14 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු වළගම්පුර නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු ගොනාගොල්ල සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.11.15 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු හිමිදුරාව නැවත ප්‍රා.ස. දක්වා ආපසු සේනාගම නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.11.16 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 60 | | 40 |
| 2022.11.17 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. ආපසු වීරගොඩ සහ එ අවට ආපසු උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.18 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට ආපසු මහකණ්ඩිය ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.11.19 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. නැවත අම්පාර සහ ඒ අවට ආපසු හිඟුරාණ ආපසු උහන ආ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.11.21 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන නගරය අවට ආපසු රජගලතැන්න නැවත ප්‍රා.ස. ආපසු වළහම්පුර නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.22 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු රුහුණුගම ආපසු අම්පාර නගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.11.23 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු සියඹලාවැව නැවත ප්‍රා.ස. ආපසු උහන නගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.24 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු වීරගොඩ නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.25 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු සේනාගම නැවත ප්‍රා.ස. දක්වා නැවත අම්පාර සහ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | 60 | | 48 |
| 2022.11.26 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ගොනාගොල්ල ආපසු වීරගොඩ නැවත ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.27 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත උහන නගරය දක්වා ආපසු මධ්‍යම කඳවුර ආපසු රුහුණුගම නැවත ප්‍රා.ස. ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.11.28 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත නවගිරියාව රජගලතැන්න ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.11.29 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අක්කරපත්තුව සාගම නැවත අම්පාර අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 96 |
| 2022.11.30 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු හිමිදුරාව නැවත වළගම්පුර ආපසු ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| | මේ මස ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | **199 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **209 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 8 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1512 ක් ධාවනයේ යෙදී ඇත) | | **189** | **1512 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **20 L** | |

10. **වෙනත්.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ නොපැමිණීම සම්බන්ධ ලිපි සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම .

1. ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා ගරු සභාපති
2. එන්.එච්. ලාල් ජයන්තසිරි මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
3. කේ.වී.ජී. නයනා කුමුදුනි මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
4. ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රී කේ.බී.විමලරත්න මහතා නිවාඩු ඉල්ලා ලිපියක් ඉදිරිපත්කර නැති බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීතුමා ඇත්තටම අසනීප තත්වයෙන් පසුවන බව , නැගිට ගන්නවත් නොහැකි තත්වයක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.එමනිසා එවැනි අවස්ථාවක තීන්දුවක් ගනිමු යැයි ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

සභාපතිතුමාත් අසනීප වී සිටින බවත් , එතුමාටත් නැගිට ගන්නවත් බැරි තත්වයක් තිබෙන බවත් ලිපියක් එවන්න කෙනෙක් නැති බව ප්‍රකාශ කල බවත් , නමුත් මා විසින් කියා සිටියේ මේ සභාවේ ක්‍රමවේදයට අනුව නිවාඩු ඉල්ලා ලිපියක් එවන ලෙසයි.එතුමා ඉන්පසු නිවාඩු ඉල්ලා ලිපියක් එවා ඇති බව ප්‍රකාශ කරන ලදි.එම නිසා හැමෝටම එකම නීතියක් තිබිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

විමලරත්න මහතා විසින් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කලොත් එයට අවස්ථාව ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපතිතුමා.(මූලාසනය )**

සභාවේ ගෙන ඇති තීන්දුව අනුව කටයුතු කලයුතු බවත් , වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කලොත් පමණක් දීමනාව ගෙවීම සිදුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මේ සභාවාරයේ අවසාන සභාව මෙය විය හැකි බවත් , එම නිසා අප සමග සිටි ජනතාවට , අප සමග සිටි නිළධාරීන්ට , අප සමග සිටි සේවකයන්ට , සියළු දෙනාටම ස්තුති කල යුතු බවත් , හදිසියේ විසුරුවා හැරියොත් ඊලග මැතිවරණයට ඒවිද , නැද්ද යන්න නොදන්නා බවත් එම නිසා සමස්ත කාර්ය මණ්ඩලයට හා සියළු දෙනාටම මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටින බව ප්‍රකාශ කරන ලදි.

**මූලාසනය.**

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2023.01.12 වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදි. එදින ප.ව. 2.00 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදි.

ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන.

2022/**12**/**15** දින රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදි.

ගරු සභාපති.